# නොනවතින අරගලය
# (යුද්ධයේ සමාජීය බලපෑම හා ශ්‍රී ලංකාවේ ජනවාර්ගික අර්බුදය)

කථිකාචාර්ය ටී. ජී. ඩී. උදයකාන්ති

## යුද්ධය යනු

පෘථිවිය මත මානව ඉතිහාසය තුළ ඔවුන් මුහුණදුන් බිහිසුණු ම අත්දැකීම යුද්ධය යි. වර්තමානයේදීද සමස්ත මානව වර්ගයාට, සත්ත්ව වර්ගයාට සහ පරිසරයට මුහුණදීමට ඇති ප්‍රබල ම අභියෝගය යුද්ධය යි. විවිධ දේශසීමා, ජනවර්ග සහ ආර්ථික ප්‍රශ්න අනුවත් අධිරාජ්‍යවාදී ක්‍රියා මාර්ග අනුවත් මිනිස් ඉතිහාසයේ මින් පෙර නො පැවති අයුරින් යුදමය වාතාවරණයක් නිර්මාණය වී ඇත.

වර්තමාන ලෝක බලවතුන් තම ශක්තිය හා බලය පෙන්වීමේ මාධ්‍යයක් ලෙස යුද්ධය යොදාගෙන ඇත.  යම් රටක භාවිත වන අවිවල සුපිරි ක්‍රියාකාරිත්වය අනුව වෙනත් රටවල් අතර තමාට හිමි තැන තීරණය වේ. මේ අනුව නවතම ප්‍රහාරක යානා, මිසයිල, න්‍යෂ්ටික අවි ආදිය පර්යේෂණය කිරීමට යොදාගත් අතර මේ සියල්ලෙහි ම සාර්ථක අසාර්ථක බව මැන බැලීමට සිදු ව ඇත්තේ සාමාන්‍ය ජනතාවට යි.  ආයුද නිෂ්පාදනයටත් එම ආයුද වර්ධනය කිරීමටත්, ප්‍රතිඅවි නිෂ්පාදනය සඳහාත් බිලියන ගණනක් වැය වේ. අද වන විට ලෝකයේ ඇත්තේ අවි තරගයකි. සමකාලීන සමාජය තුළ ඇති වන යුදමය පරිසරයට ප්‍රධානතම සාධකය ද මෙම අවි තරගය යි.

යුද්ධය, ගැටුම්, කැරලි කෝලාහලවලින් බියජනක බව හා නිරර්ථක බව ඉස්මතු කරයි. මිනිසා විසින් අතීතයේ සිට ම ඒ බව අවබෝධ කරගෙන සිටින ලදී. එවන් ක්‍රියා මිහිපිටින් තුරන් කිරීම සඳහා ලොව ඇති ප්‍රධානතම සංවිධානය එක්සත් ජාතීන්ගේ සංවිධානය යි. ඔවුන් විසින් පළමු ලෝක යුද්ධය ජාතීන් රාශියක් එක් කොට සියලු යුද්ධ ක්‍රියා මාර්ග නවතා මිනිස් අයිතිවාසිකම් කඩ නො කිරීම සඳහා ප්‍රඥප්තියක් සකස් කරගන්නා ලදී. එහෙත් එකිනෙකාගේ ආත්මාර්ථකාමීත්වය, බලකාමීත්වය හමුවේ මෙම සම්මුතිය බිඳී යන්නට වැඩි කාලයක් ගත නො වී ය. පසුව ඇති වූ දෙවන ලෝක මහා යුද්ධය අවසන් වත් ම නැවතත් සාමය තහවුරු කිරීම සඳහා 1945 ඔක්තෝම්බර් 24 වන දින රටවල් පනහක සහභාගිත්වයෙන් එක්සත් ජාතීන්ගේ සංවිධානය පිහිටුවා ගන්නා ලදී.

> "සියලු සම්මේලනවලට වඩා වැදගත් වූයේ 1945 වසන්ත සෘතුවේ දී සැන් ෆ්‍රැන්සිස්කෝහි රැස් වූ සමුළුවයි. මෙම සමුළුව මගින් කෙරුණු ප්‍රධාන කාර්යය වූයේ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ප්‍රඥප්තිය සකස් කොට අවසාන කිරීමයි. මෙම ප්‍රඥාප්තිය රටවල් පනහක් විසින් අනුමත කරන ලදී. ඒ අනුව පිහිට වූ එක්සත් ජාතීන්ගේ සංවිධානය 1945 ඔක්තෝම්බර් මස 24 වන දින උපත ලැබීය. එක්සත් ජාතීන්ගේ සංවිධානයෙහි ප්‍රධාන කාර්යාලය ආරම්භයේ දී පැරිස් නුවර පිහිට වූ අතර පසුව එය නිව්යෝර්ක් නුවරට මාරු කෙරිණි". (ඇඳගම, 1999, පිටු අංකය 454)

එක්සත් ජාතීන්ගේ සංවිධානය (United Nation Orgnization) මඟින් මේ වන විට විශාල කාර්යභාරයක් සිදු කර ඇත. සාමය ළඟා කරගැනීමේ පරමාර්ථය ප්‍රධාන කොට ක්‍රියාත්මක වුව ද බොහෝ විට මෙම සංවිධානය ලබාගෙන ඇත්තේ අසාර්ථක අත්දැකීම් ය. මෙම සංගමයට අයත් අනෙකුත් සංගම් හා ආයතනද සාකච්ඡා හා සම්මේලනවලට අයත් වන්නේ ද මෙම තත්ත්වය යි. මෑතකාලීනව ලොව පුරා ව්‍යාප්ත වූ යුද්ධ ක්‍රියාමාර්ග ඊට නිදර්ශන සපයයි.

මනුෂ්‍ය වර්ගයා සම්බන්ධ වී ඇති කරගනු ලබන අර්බුදකාරී තත්ත්වයන් යුද්ධයක් ලෙස එකහෙළා අර්ථ දැක්විය නො හැකි ය. මන්ද යත් සෑම ඝට්ටනයක් ම දෙයාකාර වූ ස්වරූපයක් ගනියි. සෑම ගැටීමක් ම යුද්ධයක් නො වේ. එහෙත් සෑම යුද්ධයක් ම ගැටීමක් වේ. ගැටුම හේතුවෙන් යුද්ධ හටගනියි. ගැටුම්කාරී තත්ත්වයක් තවදුරටත් වර්ධනය වීමට වඩා යුද්ධමය වාතාවරණ මඟින් සන්නද්ධ ගැටුමක් ඇති විය හැකි ය.

> "විවිධ ජනවාර්ගිකයන්ගෙන් සමන්විත වූ රටවල විවිධාකාරයේ වූ අභ්‍යන්තර ගැටුම් ඇති විය හැකි ය. මෙහිදී විවිධ ජනවාර්ගිකයන් එකට මිශ්‍රව වාසය කරන රටවල් වෙතින් ම වෙනම ම රාජ්‍යයන් සඳහා ඉල්ලීම් ඇති වීම ඉතා අඩු ය. එයට වෙනස් ව එබඳු රටක විවිධ ජනවර්ග වෙනස් ප්‍රදේශ තුළ වෙනම ම ජීවත්වන විටදී වෙනමම රාජ්‍යයන් සඳහා ඉල්ලීම් ඇති වී ගැටුම් ඇති වීමට ඉඩ ඇත". (දික්වැල්ල, ප්‍රියන්ත සහ හෙට්ටිආරච්චි, 2003, පිටු අංකය 01)

ඕනෑ ම සමාජයක ගැටුමක් ඇති වන්නේ විවිධ සංස්කෘතීන්ට අයත් ජාතීන් එකට ජීවත් වීමෙනි. මන්ද යත්, ඔවුන්ට අනෙකාගේ සංස්කෘතික විෂමතා ඉවසීමට නො හැකි වීමෙනි.

> ''රොස් ස්ටැන්ගර් 1967 ගැටුමක් යනු දෙදෙනකු හෝ ඊට වඩා වැඩි දෙනකු යම් අරමුණක් තමන් අතුරින් එක්කෙනකුට මිස දෙදෙනාට ම හෝ සෑම දෙනාට ම ලබා ගැනීමට නො හැකි යැයි සංජානනය කිරීමට පෙලඹෙන අවස්ථාවක් බව කියයි''. (බාලසූරිය, 1999, පිටු අංකය 14)

යුද්ධය හටගන්නේ ගැටුමෙනි. සමාජයෙහි යුද්ධයකට හේතු වන ගැටුම් ලියලා යන අයුරු රූපසටහනකින් මෙසේ දැක්විය හැකි ය.

යුද්ධයට හේතු වන ගැටුම් වර්ධනය වන ආකාරය




(අශෝක, 2006, පිටු අංකය 450)

මෙවැනි ගැටුමකින් බොහෝ විට සිදු වන්නේ අහිතකර විපාක ය. සුළු දේපළ හා ජීවිත විනාශයන්ගෙන් පටන්ගන්නා යුද ගැටුම් අවසානයේදී රටවල් විනාශ කරන ඇතැම් අවස්ථාවල පරම්පරා ගණනකට අනිසි බලපෑම් ඇති කරවන තත්ත්වයට පත් වී ඇති බව ඉතිහාසය පිරික්සීමේදී හඳුනාගත හැකි ය.

## යුද්ධය පිළිබඳ නිර්වචන

යුද්ධය පිළිබඳ නිශ්චිත නිර්වචනයක් ඉදිරිපත් කළ නො හැකි ය. ඊට හේතුව වන්නේ යුද්ධයෙහි ස්වරූපය නිරන්තරයෙන් වෙනස් වීම යි. එයට චින්තකයන්, දාර්ශනිකයන්, ආගමික නායකයන් විවිධාකාර වූ අර්ථ විග්‍රහයන් විවිධ දෘෂ්ටිකෝණයන්ගෙන් ඉදිරිපත් කර ඇත. මෙහිදී උක්ත විචාරක අදහස් කෙරෙහි අවධානය යොමු කිරීමේදී යුද්ධය යනු කුමක් ද යන ප්‍රස්තුතයට කිසි යම් හෝ පිළිතුරක් සොයාගැනීම එතරම් අපහසු නො වේ.

ඔක්ස්ෆර්ඩ් ශබ්දකෝෂයේ යුද්ධය පිළිබඳ අර්ථ නිරූපණය කර ඇත්තේ මෙසේ ය.

> ''ක්‍රියාකාරීව ජීවත් වන්න හෝ විරුද්ධවාදී කණ්ඩායම් අතර හෝ පුද්ගල මතවාද අතර ඇතිවන්නා වූ සට්ටනය හෝ විරුද්ධ තත්ත්වය යුද්ධය යි''. (Wehmeier, 1948" P. 17)

මෙවන් තත්ත්වයන් ලෝක ඉතිහාසයේ දුර්ලභ නො වේ.

> ''අප දන්නා පැරණිම නගරය මීට වසර 8000 කට ප්‍රථමයෙන් ඉදි වූයේ පෙරිකෝහි ය. එහෙත් නාගරික ශිෂ්ටාචාරයක් බිහි වූයේ සිරියානු කාන්තාරයේ පිහිටි සුමේර්හි ය. මීට වසර 5000-6000 ත් අතර කාලයේ දී ලෝකයේ ප්‍රථම අධිරාජ්‍යය බිහි වූයේ මෙහිය. ගෝත්‍රවාදී හැඟීම් උත්සන්න වීමත්, තවත් හේතු නිසාත් මානව සම්බන්ධතා ගිලිහී ගොස් පෞද්ගලිකත්වය සමග බැඳී පැවතුණු හැඟීම් වර්ධනය වී ගිය නිසා මිනිසාගේ අමනුෂ්‍යකම් තවත් වැඩි විය''. (සෙනෙවිරත්න, 1990, පිටු අංකය 24)

සමාජ විද්‍යාඥයන්ගේ හා මානව විද්‍යාඥයන්ගේ අදහස් සලකා බැලීමේදී මිහිමත යුද්ධයක් නො තිබුණු කාලයක් නො වී ය. එනම් තම තමන්ගේ පෞද්ගලික පරිභෝජනය සඳහා අවශ්‍ය දෑ තමා ම නිෂ්පාදනය කරගත් කාලයේදී අන් අයගේ දෑ කොල්ලකෑමේ අවශ්‍යතාවක් නො වී ය. එහෙත් හුදෙකලාවේ සිටි ජන කණ්ඩායම්වලට හිමි වූ ඉඩ ප්‍රමාණය පටු වෙමින් එක් ජන කණ්ඩායමක් තවත් ජන කණ්ඩායමක සීමාවන් ආක්‍රමණය කරන තත්ත්වයක් ඇති විය. ගෝත්‍ර යුගයේ සිට මේ දක්වා පැවති මිනිසාගේ ආක්‍රමණශීලී ස්වභාවය හේතුවෙන් යුදමය ඉතිහාසයක් නිර්මාණය වී ඇත. යුද්ධය පිළිබඳ අදහස් දක්වන ජෝන් රස්කින් (JhonRuskin), මෙසේ කියයි.

> ''ලොව සියලු ම ශ්‍රේෂ්ඨ ජාතීන්ගේ වචනයේ සත්‍යයත්, සිතීමේ සත්‍යයත් යුද්ධයෙන් උපන් බවත්, එය සාමයෙන් අපතේ හරින ලද බවත් මම සොයාගතිමි. ඔවුහු යුද්ධයෙන් වැඩියෙන්ම උගත් අතර සාමයෙන් මංමුළා වූහ.

ඔවුහු යුද්ධයෙන් පුරුදු පුහුණු කරනු ලැබූ අතර සාමයෙන් පාවා දෙනු ලැබූහ. වෙනත් වචනවලින් කිවහොත් ඔවුහු යුද්ධයෙන් මෙලොව ආහ. සාමයෙන් පරලොව ගියහ'' (Nehru, 1982, P. 628)

මෙම නිර්වචනයෙන් පැහැදිලි වන්නේ යුද්ධය යනු මානව සමාජ පරිණාමයට හේතු වූ ප්‍රධාන සාධකයක් බවත් එය ඉගෙනුම් ක්‍රියාවලියක් වූ බවත් ය. මනෝ විද්‍යාඥයකු වන කාල් යුංග් (Carl Jung) යුද්ධය පිළිබඳව මනෝ විද්‍යාත්මක අර්ථකථනයක් සපයා ඇත.

''අද දින අපට මහත් තර්ජනයක් වන මහත් ව්‍යසනයන් භෞතික හෝ ජීව විද්‍යාත්මක න්‍යායන් මත පදනම් වූ වාස්තවික සිදුවීම් නො වන්නේ ය. ඒවා මානසික මුහුණුවරක් ගන්නා වූ සංසිද්ධීන් ය. අපව මහත් සේ සසල කරන තරම් වූ පරිණාමයකට යුද්ධවලින් හා විප්ලවයන්ගෙන් අප මහත් අනතුරකට භාජනය වී ඇත. ඇත්තෙන් ම කිවහොත් ඒවා චෛතසිකමය වසංගත හැර වෙන කිසිවක් නො වේ''. (වීරසූරිය, 1996, පිටු අංකය 87)

මෙම අදහසට සමාන අදහස් කාල් යුංග් ඔහුගේ සිවිලයිසේෂන් ඉන් ට්‍රාන්සිෂන් Civilization in Transition කෘතියේ දක්වා ඇති අතර යුද්ධය මානසික ක්‍රියාකාරිත්වයට අනුගත කළ යුතු වන්නක් බව ලේඛකයකු වන නීල් බෙල් Neil Bell පවසන බව ද එම කෘතියේ තවදුරටත් සඳහන් වේ.

''මිනිස් ගැටලු පිළිබඳ බෞද්ධ විග්‍රහ'' නම් කෘතියේ තිස්ස ඥාණතිලක හිමි උපුටා දක්වන පරිදි ''බර්න්හාඩි (Bernhardi) සහ මුසෝලිනි යුද්ධය පිළිබඳව මෙසේ නිර්වචනය කරයි.

''යුද්ධය වූකලී ජීව විද්‍යාත්මක අවශ්‍යතාවයකි. එය ආචාර විද්‍යාත්මක චාරිත්‍ර පද්ධතියේ අත්‍යවශ්‍ය අංගයක් වේ. අවශ්‍ය අවස්ථාවලදී යුද කිරීම් නිවැරදි මෙන් ම ආචාරාත්මක හා දේශපාලනාත්මක යුතුකමක් ද වේ''. (වීරසූරිය, 1996, පිටු අංකය 112)

මිනිසා උපතින් ම සටන්කාමී ය. පළමු ව ඔහු ස්වභාව ධර්මය සමග සටන් කර තමන්ට සුදුසු පරිදි ස්වභාව ධර්මය සකසාගනියි. ඔහුගේ මනස ආක්‍රමණශීලී ය. යුද්ධය පිළිබඳ මුසෝලිනිගේ අදහස් පහත දැක්වේ.

> ''මුළු මහත් මානව ශක්තිය ඉහළම හිණිපෙත්තට ම නංවනු ලබන්නේ යුද්ධය විසින් පමණි. යුද්ධය එයට මුහුණදීමට තරම් ධෛර්යයක් ඇති සෑම දෙනා කෙරෙහි ම ශ්‍රේෂ්ඨත්වයක් ආරෝපණය කරයි''. (වීරසූරිය, 1996, පිටු අංකය 112)

මෙම නිර්වචනයෙන් මුසෝලිනි ඉස්මතු කරන්නේ යුද්ධය මානව ශක්තිය පෙන්වන නිර්ණායකයක් බව යි. එය ප්‍රත්‍යක්ෂ කිරීමට අවශ්‍ය සාධක වත්මන් ලෝකයෙහි ඇත. සැබැවින් ම අද අමෙරිකාව අන් රටවලට වඩා ඉදිරියෙන් සිටින්නේ එහි යුද්ධ ශක්තිය හේතුවෙනි. ඇරිස්ටෝටල් (Aristotle) යුද්ධය පිළිබඳ අදහස් දක්වන්නේ

> ''සාමය ඇති කිරීමට යුද්ධය යොදා ගත්තාට වරදක් නැත'' (Aristotle, 1986, P. 329)

ලංකාවේ ද සිදු වුයේ එවැන්නකි. එහෙත් සංකල්ප දෙක පරස්පර ය. ශ්‍රී ලංකා රජය ද්‍රවිඩ ඊළාම් විමුක්ති කොටි (එල්. ටී. ටී. ඊ.) සංවිධානය සමග යුද වැදුණේ සාමය ස්ථාපිත කිරීම උදෙසා ය.

> ''අප තුළ වෙසෙන්නා වූ මෘගයා හීලෑ නො වුණ තාක් කල් යුද්ධයෙන් මෙන් ම යුද සේනාංක ද අප අතර පවතීවි. ඉතා උසස් ශිෂ්ටාචාරවත් වූ මිනිස්සු පවා විටෙක ම්ලේච්ඡ බවට හැරෙති''. (Radhakrishan, 1961, P. 84)

මිනිසා යුද වැදුණේ ශිෂ්ටාචාර ගත වීමට පෙර ය. ඒ ගෝත්‍ර ගෝත්‍ර අතර ය. පසුව ශිෂ්ටාචාර ගත වූ මිනිසා භූමියට සටන් වැදුණි. ඔවුන් එසේ වන්නේ සදාචාරාත්මක පැතිකඩ අමතක කර ධනය බලය මත මානසිකත්වය සංවිධානය වූ විට ය. ලියෝ ටෝල්ස්ටෝයිගේ 'යුද්ධය හා සාමය' කෘතියේ යුද්ධය අර්ථ දක්වා ඇත්තේ,

> "යුද්ධය යනු ආචාර සම්පන්න ක්‍රීඩාවක් නොව එය මිනිස් ජීවිතයට සම්බන්ධ දෙයකි. ඒ නිසා එය තේරුම් ගෙන අපි යුද්ධයත් සමග සෙල්ලම් නො කළ යුතු වෙමු...." යුද්ධය අලසයන්ගේ හා නිස්සාර ජීවිත ගත කරනවුන්ගේ ප්‍රියතම විනෝදාංශය වෙයි. යුද්ධ කාර්යය තරම් උසස් ගෞරවයක් හිමි වන වෙනත් වෘත්තියක් නොමැත්තේ ය. චරපුරුෂ සේවය, කුමන්ත්‍රණයකට අනුබල දීම, රටක් වනසා දැමීම එය කොල්ලකෑම හා යුද හමුදාවල නඩත්තුව සඳහා එහි වැසියන් සතු දේ පැහැර ගැනීම, වංචාව සහ බොරුව යන යුද්ධ කලාවන් වශයෙන් මාතෘකා යොදමින් හැඳින්වෙන මේ හැම දේම යුද්ධය සඳහා යොදා ගැනෙන ආයුද වේ" (වීරසූරිය, 1996, පිටු අංක 95-96)

මින් පැහැදිලි වන්නේ යුද්ධය මනා උගත්කමකින් තොරව කළ නො හැකි ය. ඒ සඳහා පුහුණුවක් අවශ්‍ය වේ. එහෙත් එය නිස්සාර ජීවිත ගත කරන අයගේ අවකාශී මානසිකත්වය මත සංවිධානය වූ ක්‍රියාවලියකි.

> "ප්‍රංශ මහා ගත්කරු වික්ටර් හියුගෝ (Victor Hugo) ද ප්‍රංශයේ ඇති වූ විශාල සිවිල් යුද්ධය පාදක කරගෙන ලියූ ලෙස් මිසරාබල්ස් (Les Miserable) කෘතියේ යුද්ධය පිළිබඳ වැදගත් අදහස් කීපයක් අන්තර්ගත කරයි. තැනක ඔහු කියන්නේ දියුණුවේ මාවත වැටෙන්නේ යුද්ධය යන බිහිසුණු සාධකය මුලෝත්පාදනය කොට දැමීමෙන් බව යි" (වීරසූරිය, 1996, පිටු අංකය 96)

විශාල කලා කෘති ප්‍රමාණයකට යුද්ධය තේමා වූ අතර ඒ සියල්ලෙන් පෙන්නුම් කළේ යුද්ධය ව්‍යසනයක් බව යි. එය මානව සංහතියේ උන්නතියට මඟ වසන ක්‍රියාවලියක් බව යි.

> "යුද්ධය යනු සමකාලීන සමාජය තුළ විස්තර කළ හැකි අතර භෞතික විරුද්ධවාදීහු එදිරිවාදි රාජ්‍යයන් අත්පත් කරගැනීම සඳහා රාජ්‍යයන් රාජ්‍යයන් අතර සංවිධානය කරගත් යුද්ධමය බලය යෙදවීම යි" (Halsey & Johnston, 1988, Pg.230)

Coller's Encyclopedia හි දක්වන්නේ යුද්ධය වත්මන් සමාජවල රාජ්‍යයන්ට එරෙහි ව දියත් කරන්නක් ලෙස යි. New Standard Encyclopedia හි දක්වන පරිදි යුද්ධය යනු සන්නාහ සන්නද්ධ ප්‍රචණ්ඩත්වය යොදගැනීම තුළ රාජ්‍යයන් අතර ඇති වන ගැටුම හෝ එක ම රාජ්‍යයක කොට්ඨාසයන් දෙකක්, කණ්ඩායම් දෙකක් හෝ රටවැසියන් අතර ඇති වන ගැටුම් වේ. මේ අනුව යුදමය තත්ත්ව නිර්මාණය වේ. මෙය යුද්ධය දෙයාකාරයකින් දක්වා ඇත.

1. ජාත්‍යන්තර යුද්ධය (International War)
2. සිවිල් යුද්ධය (Civil War)

ජාත්‍යන්තර යුද්ධය යනු රාජ්‍යයන් අතර ඇති වන යුද්ධමය තත්ත්වයන් වන අතර, සිවිල් යුද්ධය යනු එක ම රාජ්‍යය කණ්ඩායම් අතර, පුරවැසියන් අතර ඇති වන යුද්ධමය තත්ත්වයකි.

> "එක ම රාජ්‍යයක් තුළ දේශපාලනික වශයෙන් සංවිධානය වූ කණ්ඩායම් අතර හෝ ප්‍රධාන ජාතිය හා සුළු ජාතීන් අතර ඇති වන භෞතික ගැටුම් වේ. එහිදී නිදහසේ එකට ජීවත් වීමේ හැකි යාව, සමාජ බැඳීම්, අන්‍යොන්‍ය ව එකිනෙකා අතර ප්‍රමාණවත් පරිදි එකඟත්වයක් ඇති කරගැනීම සහ සාමකාමීත්වය යන අර්ථයන්ට විරුද්ධ ව තාර්කික විකල්පයක් වශයෙන් කරනු ලබන ක්‍රියාදමය සන්නද්ධ ගැටුම ලෙස හැඳින්වේ" (Scott,1987,Pg.464)

ඒ අනුව යුද්ධය රාජ්‍යයක සාමයට විරුද්ධ ව ඇති වන තත්ත්වයක් බව පැහැදිලි වේ. එහිදී මානව අයිතිවාසිකම් උල්ලංඝනය වන බව වක්‍ර ව සඳහන් වේ. නිදහසේ එකට ජීවත් වීමේ අයිතිය, මානව සමාජයේ අන්‍යොන්‍ය හැඟීම් පලුදු වීමට යුද්ධය හේතු වන බව සමාජ විද්‍යා ශබ්දකෝෂයේ සඳහන් කරයි.

යුද්ධය පිළිබඳව සඳහන් කරන දේශපාලන විද්‍යාව ශබ්දකෝෂයේ සඳහන් වන්නේ, පක්ෂයන් අතර ඇති වන සන්නාහ සන්නද්ධ ගැටුම යුද්ධය වශයෙන් සරල ව අර්ථ දැක්විය හැකි අතර, එය දේශපාලන ක්‍රියාවලිය සාමාන්‍ය දෙයක් වන අතර, රාජ්‍යයන්

හෝ අධිරාජ්‍යයන් අතර, දේශපාලන ඒකකයන් අතර, දේශපාලන අරමුණු ඉටු කරගැනීම ප්‍රධාන අරමුණු කොටගෙන බලය යෙදීම යුද්ධයකදී සිදු කරයි යන්න යි.

ඉහත නිර්වචන පරීක්ෂා කර බැලීමේදී තහවුරු වන්නේ යුද්ධය ඉතිහාසයේ කවදත් බොහෝ විට කතාබහට ලක් වූ මාතෘකාවක් බව යි. විවිධ විද්වතුන් මේ පිළිබඳව විවිධ අදහස් ඉදිරිපත් කර ඇත. කෙසේ නමුදු යුද්ධයෙන් වියුක්ත සමාජ ක්‍රමයක් මිහිපිට ඇති කිරීම කළ නො හැක්කකි. එය එතරම් ආක්‍රමණශීලී මානව වර්ගයාට සමීප ය. යුද්ධය පිළිබඳ විවිධ දෘෂ්ටි කෝණයන්ගෙන් විග්‍රහ ඉදිරිපත් කර ඇත. වරෙක ඊස්කිලස්, සොපොක්ලීස්, විලියම් ෂේක්ස්පියර්, බර්ටෝල්ට් බ්‍රෙස්ට් වැනි නාට්‍යකරුවෝ ද ලියෝ ටෝල්ස්ටෝයි වැනි ගත්කරුවෝ ද තම නිර්මාණවලින් යුද්ධය පිළිබඳ සංකල්පය ඉස්මතු කළහ. ග්‍රීක ඉතිහාසඥ තුසිඩයිඩීස් (Thusydides) යුද්ධය අලළා ද "පොලෝපෝනිසියන් වෝර්ස් (The Pelopponesian Wars) නම් ඉතිහාස කෘතිය ද නාට්‍යකරුවකු වන විලියම් ශේක්සිපියර් ඔහුගේ "කොරියලානුස"(Coriolanus) නම් නාට්‍යයෙන් ද, හර්මන් මෙල්වයිල් (Herman Melville) නම් ලේඛකයා නිර්මාණය කළ මොබිඩික් (Moby Dick) නම් නවකතාව මගින් ද, විලියම් ගෝල්ඩින් (William Golding) ගේ ලෝර්ඩ් ඔෆ් ද ෆ්ලයිස් (Load of the Flies) නම් ළමා නවකතාවෙන් ද යුද්ධය පිළිබඳ විවිධ අදහස් පළ කර ඇත.

එසේ ම ප්ලේටෝ, ඇරිස්ටෝටල්, නීට්ෂේ වැනි දාර්ශනිකයන් ද, ශබ්දකෝෂ හා විශ්වකෝෂවල ද යුද්ධය පිළිබඳ නිර්වචන දක්වා ඇත. ඇතැමකු එය සමස්ත මානව වර්ගයාට පොදු ලෙස ද, තවත් අයකු එය මානසික ප්‍රශ්නයක් බව ද, ඇතැමකු එය සමාජ ස්තරායණයේ අනිෂ්ට ප්‍රතිඵලයක් බව ද, හිට්ලර්, මුසෝලිනි වැනි යුද නායකයන් එය සමාජ ප්‍රගතියට හේතු වන බව ද, තවත් අයකු එය සමාජ ව්‍යසනයක් ලෙස ද අර්ථ දක්වා ඇත. කෙසේ නමුදු යුද්ධය යනු පාර්ශ්වයන් දෙකක් අතර එකිනෙකාගේ අරමුණු මුදුන් පමුණුවාගැනීමේ අරමුණින් දියත් කරන සමාජ ගැටුමක් ලෙස සරල ව අර්ථ දැක්විය හැකි ය.

## යුද්ධයේ ඓතිහාසික පසුබිම හා විකාශනය

මිනිසාගේ ඉතිහාසය යම් තරමකට පැරැණි ද යුද්ධයේ ඉතිහාසය ද ඒ තරමටම පැරැණි ය. යුද්ධය වර්තමානයේ මේ මිහිතලය මත වෙසෙන සියලු සත්ත්ව වර්ගයාටත් පරිසරයටත් මුහුණදීමට ඇති බිහිසුණු ම ගැටලුව යි. එසේ ම මානව වර්ගයාට මුහුණදීමට සිදු වන බිහිසුණු ම අත්දැකීම ලෙස හැඳින්විය හැකි ය. යුද්ධය මනුෂ්‍යය ඉතිහාසය හා අත්‍යන්තයෙන් ම බැඳී පවතියි. මානව ඉතිහාසයේ නො දියුණු යැයි සැලකෙන අවධියේ පටන් ම යුද්ධය පැවත ඇත. දඩයම් යුගයටත් පෙර සිට ම යුද්ධය ඇති වී තිබෙන්නට ඇතැයි විශ්වාස කැරේ. තවදුරටත් ලෝක ඉතිහාසයේ තොරතුරු ගවේෂණය කිරීමෙන් යුද්ධයේ ආරම්භය පිළිබඳ අදහස් ගොඩනගා ගත හැකි ය.

> "විද්‍යාඥයන් පෙන්වාදෙන අන්දමට පොළොව වසර 2,000,000,000 තිස්සේ පැවත ඇති අතර මිනිසා ජීවත් ව ඇති වසර සංඛ්‍යාව යන්තම් වසර 50,000 ක් පමණ වේ. පොළොවේ වයස සමග සසඳතහොත් හුදෙක් වසර 40,000 කින් එකක් පමණි. ගත වූ වසර සියදහස් ගණන් තිස්සේ මිනිසා ශාරීරික, මානසික වශයෙන් ද ව්‍යුහමය හා චර්යාමය වශයෙන් ද නොයෙකුත් විපර්යාසයන්ට භාජනය වූ නමුත් ගැටීම, යුද්ධය දවසින් දවස වර්ධනය වූයේ ගුණාත්මකභාවයෙන් වැඩි විනාශයක් ළං කරදෙමිනි" (සෙනෙවිරත්න, 1990, පිටු අංකය 23)

භූවිද්‍යාඥයන් පවසන පරිදි මේ පොළොව තලය හැඩගැසුණේ වසර මිලියන දහස් ගණනකට පෙර බව පැහැදිලි ය. මානව විද්‍යාඥයන් හා පුරාවිද්‍යාඥයන් පූර්ව ඓතිහාසික යුගවල මිනිසා භාවිත කළ උපකරණ පිළිබඳව දිගු කලක සිට අධ්‍යයනය කර ඇත. මෙහිදී පෙනී යන කරුණක් නම් මානව සමාජයේ ආදිතම මනුෂ්‍ය සමාජයෙහි මිනිසා දඩයමින් තම ජීවිකාව ගෙන ගිය අතර, ඔවුන්ගෙන් ආරක්ෂා වීම වෙනුවෙන් හා ජීවත් වීම වෙනුවෙන් ඒ සඳහා අවශ්‍ය උපකරණ, ආයුද හෙවත් මෙවලම් සාදගෙන ඇති බව යි. රළු ගලින් නිපදවූ අතර මිනිස් ඉතිහාසයේ මුල් ම ජයග්‍රහණය ලෙස ගින්දර, කෙටේරිය සොයාගැනීම ආදිය දැක්විය හැකි ය.

"ප්‍රාථමික ජනතාව ජීවත් වුයේ සමූහ වශයෙන් වනාන්තරවල වූ අතර ආහාර සපයාගත්තේ දඩයම් කිරීමෙනි. මොවුන්ගේ සමාජ තුළ නීතියක් තිබුණේ නැත. ඔවුන්ගේ එක ම ක්‍රියාකාරිත්වය වූයේ සටන් කිරීම යි. එහිදී දඩයමට ලක් වන සතුන් සමග සටන් කළ අතර සමූහයක් අතර ද ගැටුම් ඇති විය. මෙය ගැටුම් විධිමත් සැලැස්මකට, විධානයකට හෝ ක්‍රමානුකූල ව සිදු නොවුණි. (Halsey & Johnston, 1988, Pg.235)

එසේ ම ක්‍රමයෙන් මිනිසා නව ශිලා යුගයට පා තැබූ අතර එහිදී දව, ශිලා හා ඇත්දත් උපයෝගී කරගෙන පොරොව, කප්පිය, ඉදිකටුව, ඉණිමග, බිලී කොක්ක, ඇඹරුම් ගල ආදිය නිපදවාග නී. බටහිර ආසියාවේ මිනිසුන් විසින් ක්‍රි. පූ. 4000 දී පමණ තඹ සොයාගත් අතර, කිරිච්චිය, පිහිය, පොරොව ආදි ආයුද හා මෙවලම් සකස් කරගන්නා ලදී. මෙය ලෝහ යුගය වේ. මිනිස් ඉතිහාසයේ මෙම සොයා ගැනීම් මිනිසා සිය සමාජ පරිසරයේ පැවති ආක්‍රමණකාරී හැගීම උදෙසා සූදනම් වීමක් වශයෙන් දැක්විය හැකි ය.

ගෝත්‍රික යුගයේදී යුද්ධයට ශුද්ධ මුහුණුවරක් ආදේශ විය. ගෝත්‍රිකයන් අතර බිලි පූජා ප්‍රකට යාතුකර්මයක් විය. එහිදී බිලි පූජා සඳහා වෙනත් ගෝත්‍රවල මිනිසුන් යුද්ධ කොට පැහැරගත් බව ජේම්ස් ෆ්‍රෙසර් (Jemes Frozer) ඔහුගේ 'The Golden Bough' නම් කෘතියේ සඳහන් කරයි. මෙවන් තත්ත්වයක් මායාවරුන් අතර ද දක්නට ලැබිණි.

"මායන්වරුන් ඔවුන්ගේ ආගමික උරුමයන් සුරැකීමට ඉන්පසු පැමිණි මෙක්සිකන්වරු අසමත් වූ අතර ඔවුහු පසුව බිලි පූජාවන් පැවැත්වීමට පවා උත්සුක වූහ" (Toynbee, 1962, Pg.127)

පුරාණ ඇස්ටෙක්වරු ද (Aztec) මෙවන් චාරිත්‍රයක් සිදු කර ඇත. ඒ අනුව මානව ඉතිහාසයේ සෑම මොහොතක ම යුද්ධය යන සාධකය ඉස්මතු වී ඇත.

ගෝත්‍රික සමාජ විකාශනය වී අධිරාජ්‍ය බිහි වීමත් සමග මානව සබඳතා බිඳී ගොස් පෞද්ගලිකත්වය සමග බැඳී පැවතුණු

හැඟීම් ඉස්මතු වීමත් යුදමය තත්ත්වයන්ට මාර්ග සකස් කෙරිණි. ඉතිහාසය පුරා ම ශිෂ්ටාචාර ගොඩනැඟීම හා බිඳ වැටීම සිදු විය. ඒ ගෝත්‍රික සමාජ තුළ ය. එහෙත් මිනිසා ශිෂ්ටාචාර ජීවිතයකට හැඩගැසී වඩා සංවිධානාත්මක පාලන ක්‍රමයක් ඇති කරගත් පසුව ද විශාල සටන් ලොව පුරා දක්නට ලැබිණි.

> "මෙසපොටේමියානු ශිෂ්ටාචාරය නිරන්තරයෙන් ආක්‍රමණවලට ගොදුරු වූ අතර ක්‍රි. පූ. 2100 පමණ එයට තදින්ම පහර වැදිණි. ඇසිරියන්, ඊජිප්තු, ඉන්දු ආදි ශිෂ්ටාචාරවල ද නිරන්තරයෙන් යුදමය වාතාවරණයක් ඇති විය" (සෙනෙවිරත්න,1990, පිටු අංකය 24)

රාජා කටුගම්පොළ විසින් රචිත "සංග්‍රාම පුරාණය" නම් කෘතියේ සඳහන් කරන පරිදි ක්‍රි. පූ. 1150 දී පමණ සිදු වූවා යැයි සැලකෙන රාම-රාවණ යුද්ධයත්, ක්‍රි. පූ. 1025 දී පමණ සිදු වූ ඇසිරියන්- චැලඩියන් සංග්‍රාමය, ක්‍රි. පූ. 600 දී පමණ සිදු වූ චැලඩියන්- පර්ෂියන් අධිරාජ්‍යය සංග්‍රාමය, ඇතැන්ස් - ස්පාර්ටා සටන, මහා ඇලෙක්සැන්ඩර් තෙවැනි ඩේරියස් සංග්‍රාමය, ග්‍රීක ජනරාල් සෙලියුකස්ගේ ඉන්දීය ආක්‍රමණය, ගෝත්‍රික ආක්‍රමණ හමුවේ රෝම අධිරාජ්‍යයේ බිඳ වැටීම, කලෝවිස් - සියග්‍රියස් සටන, කැරොලියන්ජියන් - මුස්ලිම් සංග්‍රාමය, ශුද්ධ යුද්ධය හෙවත් කුරුස යුද්ධය ආදිය යුද ඉතිහාසයේ සංධිස්ථාන ය.

චීනය, ස්පාඤ්ඤය, පෘතුගාලය සහ අරාබි ජාතිකයන් ආදි සියලු ම ජාතීහු මෙලෙස යුදමය ඉතිහාසයකට හිමිකම් කියති. කුරුස යුද්ධ වශයෙන් හැඳින්වෙන යුද්ධ තුනක් යුද ඉතිහාසයේ සඳහන් ව ඇත.

> "ක්‍රි. ව. 1096 දී ප්‍රථම ශුද්ධ හෙවත් කුරුස යුද්ධය ඇඹුණි. එම යුද්ධයට රජවරුන් සහභාගී නොවී කුමාරවරුන් නායකත්වය දීම නිසා කුමාර යුද්ධය නමින්ද ප්‍රචලිත විය"(කටුගම්පොළ, 2007, පිටු අංක 140)

1099 දී ජෙරුසලම අතපත් කරගැනීමත් සමග ප්‍රථම කුරුස යුද්ධය අවසන් විය. ප්‍රථම කුරුස යුද්ධයෙන් පරාජය ලැබුවත් සිය අරමුණු අභිලාෂයන් අත නො හරින ඉස්ලාමීය තුර්කි සෙල්ජෙකන්වරුන් ක්‍රි. ව. 1144 දී වඩාත් සන්නද්ධ වෙමින්

ජෙරුසලම ප්‍රාන්තයට අයත් එඩෙස්සා ප්‍රාන්තයට ප්‍රහාරයක් එල්ල කළේ දෙවන කුරුස යුද්ධයට හෙවත් දෙවන ශුද්ධ යුද්ධයකට මුල පුරමිනි.

> "තෙවන ඉයුජිනියස් පාප් වහන්සේ විසින් දෙවන කුරුස යුද්ධය ප්‍රකායට පත් කළේ මේ පසුබිම තුළ ය. බිහිසුණු යුද්ධයකට මැදි ව ජෙරුසලම් රාජ්‍යය සටන පවත්වාගෙන යද්දී ක්‍රි. ව. 1147 දී ප්‍රංශයේ හත්වෙනි ලුවිස් රජ හා රෝම අධිරාජ්‍යයා විශාල හමුදවක් නැගෙනහිර ප්‍රදේශයට යැවීමට කටයුතු කළහ. ඔවුන් උත්සාහ කළේ තුර්කි හමුද අත තිබූ සිරියාවේ ඩැමස්කස් නගරය අත්පත් කරගනිමින් ජෙරුසලම ආක්‍රමණය අඩපණ කිරීමට යි. එහෙත් දෙවන කුරුස යුද්ධය ක්‍රි. ව. 1149 දී නිමා වූයේ ඩැමැස්කස් සටනින් රෝම හමුද පරාජය අත්පත් කරගනිමිනි. (කටුගම්පොළ, 2007, පිටු අංකය 143)

එහෙත් දෙවන කුරුස යුද්ධයෙන් ජෙරුසලම දිනාගැනීමට ඉස්ලාමීය හමුද සමත් නො වී ය.

> "රජවරුන්ගේ ශුද්ධ යුද්ධය නමින් ප්‍රකට වූ තෙවන කුරුස යුද්ධයට ක්‍රි. ව. 1189 දී ශුද්ධ රෝම අධිරාජ්‍යයේ ෆෙඩ්රික් බාර්බරෝසා අධිරාජ්‍යයාත් එංගලන්තයේ පළමුවෙනි රිචඩ් රජතුමාත් ප්‍රංශයේ පිලිප් ඔගස්ටස් රජතුමාත් එක් වූහ. ක්‍රි. ව. 1192 දී තෙවැනි ශුද්ධ යුද්ධය නිමා කෙරුණේ තුර්කි සෙල්ජත් අධිරාජ්‍යය සැලඩින් හා එංගලන්තයේ රිචඩ් රජු අතර ගිවිසුමක් අත්සන් කරමිනි" (කටුගම්පොළ, 2007, පිටු අංකය 143)

ඉහත තෙවන කුරුස යුද්ධය උමා යුද්ධය ලෙස ද ලොව ප්‍රකට ය. එම යුද්ධය නිමා වන්නේ ඉස්ලාමීය තුර්කි සෙල්ජුක්වරුන්ට ජෙරුසලම අත්පත් කරදෙමිනි. පහළොස්වන ශතවර්ෂයේදී බ්‍රිතාන්‍ය සිවිල් යුද්ධ රැසකට මුහුණපෑ ආකාරය ලෝක යුද ඉතිහාසයේ සඳහන් වේ. ඒ අතර ක්‍රි. ව. 1461 දී, ක්‍රි. ව. 1464 දී, ක්‍රි. ව. 1485 වසරවලදී බ්‍රිතාන්‍ය තුළ යුද්ධ ඇති වූ අතර මෙය බ්‍රිතාන්‍යයේ "රෝස මල් යුද්ධය" ලෙස හැඳින්වෙන බව "සංග්‍රාම පුරාණය" කෘතියේ වැඩිදුරටත් සඳහන් කර ඇත.

19 වන සියවසේ යුරෝපයේ යුද්ධයක් නො පැවති වසරක් සොයාගත නො හැකි විය. 20 වන සියවසේ ආරම්භක වසර කිහිපය තුළ, යුරෝපයේ දක්නට ලැබුණේ අපැහැදිලි එහෙත් සාමකාමී තත්ත්වයක් බව රණවක ලොකුලියන සහ සේනානායක විසින් රචිත "වර්තමාන ලෝක ඉතිහාසය" නම් කෘතියේ සඳහන් වේ. රටවල් අයිති කරගැනීමටත්, වෙළෙඳාම දියුණු කරගැනීමටත් 19 වන ශතවර්ෂයේ යුරෝපයේ ප්‍රබල රාජ්‍යයන් අතර තරගයක් පැවතිණි. මෙම තරගය හේතුවෙන් ඇති වූ ආරවුල් නිරාකරණය කර ගැනීම සඳහා ක්‍රි. ව. 1898 දී ද, ක්‍රි. ව. 1907 දී ද ඕලන්දයේ හේග් නුවර ජාතීන්ගේ සම්මේලනය පවත්වන ලදී. පසුව අමෙරිකාව, බ්‍රිතාන්‍යය, ප්‍රංශය යන රටවල් ඔවුනොවුන්ගේ වෙළෙඳාම් සාමකාමී ලෙස පවත්වාගෙන ගිය බව එහි වැඩිදුරටත් සඳහන් වේ.

1914 දී යුරෝපයේ ප්‍රබල රාජ්‍ය පක්ෂ දෙකකට බෙදී සිටියහ. මෙහිදී යුරෝපයේ සෑම ජාතියක් ම තරගයට යුද අවි නිපදවී ය. යුද්ධ කිරීම අත්‍යවශ්‍ය බව ජර්මනියෙහි හා ඕස්ට්‍රේලියාවෙහි සිටි බොහෝ දෙනකු කල්පනා කළ අතර වෙනත් යුරෝපීය රටවල් යුද්ධ කිරීමෙන් දේශපාලන අයිතිවාසිකම් ලබාගැනීමට උත්සාහ ගත්හ. 1914 ජුලි 23 සයිබීරියාවට විරුද්ධ ව ඕස්ට්‍රියා ආණ්ඩුව යුද්ධය ප්‍රකාශ කළේය. ප්‍රංශය ද, රුසියාව ද එක් වීමට තීරණය කළ අතර ඒ අවස්ථාවේ දී ජර්මනිය විරුද්ධ වූ බැවින් අගෝස්තු 4 වන දින මධ්‍යම රාත්‍රියේ දී ජර්මනියට විරුද්ධ ව යුද්ධය ප්‍රකාශ කළ බව "වර්තමාන ලෝක ඉතිහාසය" කෘතියේ සඳහන් වේ.

> ක්‍රි. ව. 1914 ජුලි මස 28 වන දිය ඇරඹුණු යුරෝපා මහා යුද්ධය ක්‍රි. ව. 1918 නොවැම්බර් මස 11 වන දින දක්වා පැවැත්තේ ය. අවුරුදු හතරකටත් වැඩි කාලයක් කැරුණු ඒ යුද්ධය හා සම්බන්ධ වූ සිද්ධීහු අනල්ප"(රණවක, ලොකුලියන සහ සේනානායක, 1959, පිටු අංකය 193)

පළමු ලෝක යුද්ධයෙන් විශාල ජීවිත ගණනක් සහ දේපළ විනාශ විය.

> "මෙම ලෝක මහා යුද්ධයට මිනිස් ජීවිත විශාල සංඛ්‍යාවක් බිලි විය. දළ වශයෙන් හානි සිදු විය. යුද්ධයේ වියදම අමෙරිකානු ඩොලර් මිලියන 200 ක් පමණ විය.

විෂ කැවූ බෝම්බ, විෂ දුම, අත් බෝම්බ වැනි භයානක අවි ආයුද මෙන් ම යුද්ධ ටැංකි, සබ්මැරීන් සහ ගුවන් යානාද භාවිත කෙරිණි. දෙවනුව මෙම මහා සංග්‍රාමය හේතු කොට ගෙන එයට සහභාගි වූ රටවල ආර්ථිකය මුළුමනින් ම විනාශ විය. යුද්ධය ආරම්භයේදීම ජාතීහු 25 ක් පමණ දෙපිලකට බෙදී යුද වැදී සිටියහ. යුද්ධය අවසන් වීමටත් පෙර එහි ජයග්‍රාහකයන්ට ද යුද්ධයේ විනාශකාරී ප්‍රතිඵල දැනෙමින් තිබුණි." (රාවෝ, 1999, පිටුව 428)

මේ අනුව යළිත් යුද්ධයක් ඇති නො වීමට වර්සේල්ස් ගිවිසුම අත්සන් කරන ලදී. ක්‍රි. ව. 1919 දී පැරිස් නුවරට රැස් වූ සාමදාන සම්මේලනය අනාගතයේදී ලෝක සාමය පවත්වාගෙන යාම සඳහා කටයුතු කළේ ය. අමරිකන් ජනාධිපත් වුඩ්රෝ විල්සන්ගේ නායකත්වයෙන් 1920 ජනවාරි මාසයේ පිහිටවූ ජාතීන්ගේ සංගමයේ ප්‍රධාන ස්ථානය පිහිටුවූයේ ස්විස්ටර්ලන්තයේ ජිනීවා නගරයේ ය. මේ පිළිබඳ තොරතුරු බී. ඒ. රාවෝ විසින් රචිත "ලෝක ඉතිහාසය" නම් කෘතියේ සඳහන් වේ.

ජාතීන්ගේ සංගමය පිහිටුවාගත්ත ද ලෝකය තුළ බලය ව්‍යාප්තිය නතර නො වීය. පළමු ලෝක සංග්‍රාමය අවසන් වනවාත් සමග ම ලෝකය දෙපිලකට බෙදිණි. එනම් ජයග්‍රාහී සහ පරාජිත යන දෙපාර්ශ්වය යි. යුද්ධය හේතුවෙන් බ්‍රිතාන්‍යය, ප්‍රංශය හා රුසියාව යන රටවල මිනිසුන් හා ධනය ද හිඟව ඇත. මීන් බොහෝ පාඩු විඳින්නට සිදු වූයේ ප්‍රංශයට ය. ජාතීන්ගේ සංගමය පිහිටුවාගත් නමුත් ඉන් සිදු වූ යහපතක් නො වීය. එය අවස්ථෝචිත ව තීරණ ගත්තේ නම් දෙවන ලෝක යුද්ධයක අත්දැකීම් විඳින්නට සිදු නො වනු ඇත. ජර්මනිය, ඉතාලිය හා ජපානය යන ෆැසිස්ට් රාජ්‍ය වලින් සිදු කළ ක්‍රියා මාර්ගයන් දෙවන ලෝක යුද්ධයකට හේතු විය. දෙවන ලෝක යුද්ධය 1939 දී ඇරඹී බව සාහිත්‍යයේ සඳහන් වේ.

"හිට්ලර් දෙවන ලෝක යුද්ධය ඇරඹීමට සිතා සිටියේ 1943-45 අතර වකවානුවක ය. එහෙත් 1939 වන විටම එය ඇරඹිණ. 1941 වන විට බ්‍රිතාන්‍යය හා රුසියාව මෙන්ම අමරිකාව ද යුද්ධයට පැටලිණි. අද්මිරාල් රිඩර්ගේ ප්‍රකාශයට අනුව හිට්ලර් බ්‍රිතාන්‍ය හා ප්‍රංශය සමග යුද්ධ ආරම්භය 1944 ට පෙර බලාපොරොත්තු වී නැත. ජර්මනිය

යුද්ධය 1939 ට පසු කලක ඇරඹීමට සිටියේ වඩා හොඳින් ඒ සඳහා සූදානම් වීමට ය. මිනිස් සම්පත් වගේ ම යුද්ධමය හා ආර්ථික වශයෙන් වැදගත් සම්පත් ද ජර්මනියට අත්‍යවශ්‍ය විය. මේවා ලබාගත හැකි වූයේ කුඩා රටවල් ආක්‍රමණය කිරීමෙන් හා ඈඳාගැනීමෙනි. ඕස්ට්‍රියාව හා චෙකොස්ලොවැකියා කර්මාන්ත ශාලාවල සාදන ලද යුද්ධ ටැංකි, තුවක්කු හා යුද්ධ රථ ජර්මනියට චෙක් දේශයෙන් ලැබුණු අතර ඒවා හැම 1940 දී ප්‍රංශයට එරෙහි ව කෙරුණු යුද්ධයට යොදවා ගැනිණි. චෙක් ජාතික කම්කරුවන් 40,000 ක් ජර්මනියේ සේවයට කැප කෙරිණ" (වීරසූරිය, 1996, පිටු අංකය 51)

හිට්ලර් දෙවන ලෝක යුද්ධය ආරම්භ කරන්නේ ලොව පුරා තම බලය ව්‍යාප්ත කිරීමට ය.

"හිට්ලර් සතුරන් පරාජය කිරීම සඳහා බ්ලිට්ස්ක්‍රිග් නම් වූ අලුත් උපාය මාර්ගයක් අනුගමනය කළේ ය. ජර්මන් යුද හමුදාව හා යුද ටැංකි යොදා පෝලන්තය ආක්‍රමණය කළ අවස්ථාවේ පෝලන්තය 1939 සැප්තැම්බර් මාසයේදී ජර්මනියට යටත් විය. ඒ වන විට ජර්මනිය සමග අත්සන් කොට තිබූ මිත්‍ර ගිවිසුම පරිදි රුසියාව පින්ලන්තයේ නැගෙනහිර කොටස ඈඳාගත්තේ ය. ඒ අතර රුසියාව පින්ලන්තයෙන් කොටසක් ද ඈඳාගත්තේ ය. 1940 දී හිට්ලර් නොර්වේ සහ ස්වීඩනය ආක්‍රමණය කොට ජය ගත්තේය. ජර්මනියට එරෙහිව දැඩි ප්‍රතිප්‍රහාරයක් දුන් නමුත් අවසානයේදී ඕලන්දය හා බෙල්ජියම ද ජර්මනියට යටත් විය. 1940 ප්‍රංශය යටත් වීමත් සමග හිට්ලර්ගේ ජයග්‍රහණයේ උච්චතම අවස්ථාව උදා වී තිබුණි. 1940 අප්‍රේල් සහ 1941 අගෝස්තු අතර කාලයේදී හිට්ලර් බ්‍රිතාන්‍යය සමග යුද්ධයකට සිය අවධානය යොමු කළේ ය. කෙසේ වුවද මෙම සටනින් ඔහුට එතරම් සාර්ථක ප්‍රතිඵල ලැබිය නො හැකි විය. ඉතාලියේ හමුදාව සමග ඒකාබද්ධ ව සැලසුම් කොට ග්‍රීසිය එකක් පසු එකක් වශයෙන් ජර්මන් හමුදාවට යටත් විය. ජර්මන් හමුදාවේ සිටි දක්ෂතම යුද්ධ

ටැංකි හමුද අණදෙන නිලධාරියකු වූ ජනරාල් රොම්වෙල් ලබා ගත් ජයග්‍රහණය උතුරු අප්‍රිකානු යුද පෙරමුණේදී හිට්ලර්ට සාර්ථක ප්‍රතිඵල ලබා ගැනීමට බෙහෙවින් උපකාරී විය" (ඇඳගම, 1999, පිටු අංකය 447))

මේ අනුව 1941 දෙසැම්බර් 07 වන දින පර්ල් වරායට පහර දුන් අතර 1942 දී ජපානය විසින් තායිලන්තය, මලයාව, බුරුමය සහ පිලිපීනය වැනි අග්නිදිග ආසියාතික රටවල් ආක්‍රමණය කළ අතර, 1943 වන විට රුසියාවද සිය ආක්‍රමණ කටයුතු ආරම්භ කරන ලදි. 1943 සැප්තැම්බර් මාසයේදී ඉතාලිය මිත්‍ර පාක්ෂිකයන්ට යටත් විය. 1945 දී රුසියානු හමුදව බර්ලින් නගරය ආසන්නයට ම සේන්දු වීමට සමත් වූ අතර කිසිවක් කර කියා ගැනීමට නොහැකි වූ බැවින් හිට්ලර් සියදිවි නසාගත්තේ ය. ඒ හේතුවෙන් 1945 මැයි මාසයේදී ජර්මනිය මිත්‍ර පාක්ෂිකයන්ට යටත් වූ බව ගුණසිරි වීරසූරියගේ "යුද්ධය "නම් කෘතියේ සඳහන් වේ.

1945 දී අමෙරිකානු යුද හමුද විසින් ජපානය වට කරනු ලැබූ නමුත් ජපානය යටත් නො වී ය. ජපානයට යටත් වන ලෙස අණ කළ අන්තිම සංඥාව නිකුත් කළ නමුත් හමුද ප්‍රධානීන් විසින් මෙහෙයවන ලද ජපන් රජය එසේ යටත් වීම ප්‍රතික්ෂේප කරන ලදී. අනතුරුව 1945 අගෝස්තු 06 වන දින පරමාණු බෝම්බයක් හෙළීමෙන් අමෙරිකන් එක්සත් ජනපදය විසින් ජපානයේ හිරෝෂිමා නගරය විනාශ කරනු ලැ බී ය. 1945 අගෝස්තු 06 වන දින නාගසාකි දිවයිනට ද තවත් පරමාණු බෝම්බයක් හෙළී ය. 1945 සැප්තැම්බර් 02 වන දින ජපන් හමුදවෝ අමෙරිකන් එක්සත් ජනපදයට යටත් වූහ. 1945 දී සිදු වූ මෙම බෝම්බ හෙළීමෙන් ජපනුන් ලක්ෂ ගණනකගේ ජීවිත අහිමි වූ අතර, මෙම නගර දෙක මුළුමනින් ම විනාශ විය. එම පරමාණු බෝම්බවල බලපෑම වසර ගණනාවක් යන තුරු ජපනුන්ට බලපෑවේ ය. ජාන විකෘති වීම හේතුවෙන් පරම්පරා කීපයක් අංගවිකල තත්ත්වයට පත් විය. දෙවන ලෝක යුද්ධයෙන් පසුව ඇති වූ ව්‍යසනය යළි සිදු නො වීමට ලොව රටවල් එකතු වී තෙවන ලෝක යුද්ධයකට අවස්ථාව නො තබමින් එක්සත් ජාතීන්ගේ සංවිධානය පිහිටුවාගත් බව සාහිත්‍ය මූලාශ්‍රය හෙළි කරයි.

දෙවන ලෝක යුද්ධයෙන් පසු ජාත්‍යන්තර දේශපාලනය තුළ හටගත් විවිධ අර්බුද පිළිබඳ ඩබ්ලිව්. එම්. කරුණාදස විසින් රචිත

"ජාත්‍යන්තර අර්බුද" කෘතියේ සඳහන් වේ. ඒ අතුරින් 1947-1966 අතර කාලයේ පැවති කාශ්මීර් අර්බුදය, 1962 දී පැවති ඉන්දීය - චීන යුද්ධය, 1948 ජූනි සහ 1949 මැයි මාසයේ ඇති වූ බර්ලින් යුද්ධය, දකුණු අප්‍රිකාවේ වර්ණභේද වාදය හේතු කොටගෙන ඇති වූ යුද ගැටුම්, 1956 සුවස් අර්බුදය, 1945-1949 කාලයේ ඇති වූ පලස්තීන අර්බුදය, 1954-1973 වියට්නාම් අර්බුදය, 1962 දී ඇරඹි කියුබන් මිසයිල අර්බුදය, 1960-1963 කාලයේ දී ඇති වූ කොංගෝ අර්බුදය, 1950-1953 කාලයේදී ඇති වූ කොරියන් අර්බුදය දැක්විය හැකි ය.

මෙසේ ලෝක ඉතිහාසය පිළිබඳව හැදෑරීමේදී පෙනී යන කරුණක් නම් මානව ඉතිහාසය පුරාම වර්ධනය වූ බවත්, ගැටුමකින්, යුද්ධයකින් හිස්වූ අවස්ථාවක් හෝ භූමියක් නො වූ බවත් ය. අතීතයේ පොලු, මුගුරු, කැට, කැබිලිති, දුනු, ඊතල, කඩුව, පොල්ල ආදි උපකරණ මඟින් යුද කළ මිනිසා නූතනයේ නවීන තාක්ෂණයත් සමග න්‍යෂ්ටික යුගයට පා තබයි.

සාමාන්‍යයෙන් යුද්ධයකදී සිදු වන්නේ එක් පාර්ශ්වයක් ජයග්‍රහණය කිරීමත්, අනෙක් පාර්ශ්වය පරාජය කිරීමත් ය. මෙය ප්‍රායෝගික සත්‍යයක් වුව ද එය ගැඹුරට විශ්ලේෂණය කිරීමේදී පැහැදිලි වන්නේ යුද්ධය අවසානයේ භුක්ති විඳීමට තරම් පුද්ගලයන් ලොව ඉතුරු වේ ද යන ප්‍රශ්නය යි. ප්‍රධාන ලෝක යුද්ධ දෙකක් අවසන් කළ අපි අද වන විට තෙවන ලෝක යුද්ධයක අභියෝගය ඉදිරියේ ජීවත් වෙමු. දිනපතා ලෝකයේ යම් තැනක කවර ප්‍රමාණයකින් හෝ යුද්ධ සිදු වේ. මේ සඳහා නිදර්ශන අප්‍රමාණ ය. කාශ්මීර් යුද්ධය, ශ්‍රී ලංකාවේ උතුරු - නැගෙනහිර යුද්ධය ඉන් කිහිපයක් පමණි. උක්ත කරුණු විමර්ශනය කිරීමේදී පැහැදිලි වන්නේ මානව විකාශනය සමග විකාශනය වූ යුද්ධය මානවයාගේ ආක්‍රමණශීලී මානසිකත්වය හේතුවෙන් වර්තමානයේත්, අනාගතයේත් දැකිය හැකි බව යි.

## යුද්ධය පිළිබඳ න්‍යායයන්

මිනිසා සංවිධානාත්මක ව ජීවන කටයුතු ආරම්භ කළ මුල් අවධියේ සිට දක්නට ලැබුණු ගැටුම් හා යුද්ධ කුමන හේතුවක් නිසා හටගත්තේ ද යන්න සොයා බැලීමට දර්ශනිකයන්, ආගමික

ශාස්ත්‍රඥවරුන් මෙන් ම දේශපාලන චින්තකයන් උත්සුක වී ඇත. යුද්ධය පිළිබඳ තොරතුරු ගවේෂණයේදී පළමු ව කළ යුතු වන්නේ ඒ පිළිබඳ අර්ථ නිරූපණයක් ගොඩනඟා ගැනීම යි. එම අර්ථ නිරූපණය සංස්කෘතික, දේශපාලනමය සහ දර්ශනික හේතු මත සංවිධානය වී ඇත. යුද්ධය පිළිබඳ න්‍යායාත්මක කරුණු ඉදිරිපත් කරන ලද්දේ ඒ පිළිබඳ අර්ථ නිරූපණයක් ගොඩනඟා ගැනීමට යි.

යුද්ධයට පදනම් වූ සාධක, ව්‍යාප්ත වීමට හේතු, ඒ සඳහා දයක වූ පාර්ශ්වයන්ගේ ක්‍රියාකාරිත්වය මත යුද න්‍යායන්ට අවශ්‍ය පදනම සකස් වේ. ඕනෑ ම න්‍යායයක් යම් මාතෘකාවකට ගොනු කිරීමේදී එහි පසුබිම හා සංකල්පමය පසුබිම විවරණය කිරීම වැදගත් වේ. යුද්ධය පිළිබඳ න්‍යායන් විවිධාකාරයෙන් හඳුනාගත හැකි ය. සාම්ප්‍රදයික න්‍යායන් හා සාම්ප්‍රදයික නො වන න්‍යායන් ලෙසත්, එසේ ම Collier's Encyclopidia හි දක්වා ඇති න්‍යායනුත්, The Encyclopidia Britanica හි යුද න්‍යායනුත් එකිනෙක සලකා බැලීමේදී යම් පරස්පර අදහස් ගෙනහැර දක්වුව ද සමහර අවස්ථාවල එක් න්‍යායක් යටතේ සාකච්ඡා කළ හැකි බව ගැඹුරින් කරුණු විමර්ශනය කිරීමේදී පැහැදිලි වේ.

Collier's Encyclopidia හි දක්වා ඇති පරිදි යුද්ධය පිළිබඳ න්‍යායන් 08 ක් හඳුනාගත හැකි ය.

1. ජීව විද්‍යාත්මක න්‍යාය Bioligical Theories
2. මනෝ විද්‍යාත්මක හා සමාජ මනෝ විද්‍යාත්මක න්‍යාය Psychological and Sociophychological Theories
3. මානව විද්‍යාත්මක න්‍යාය Anthropological Theories
4. පරිසර විද්‍යාත්මක න්‍යාය Ecological Theories
5. සදාචාර න්‍යාය Moral Theories
6. යුද තාක්ෂණික න්‍යාය Military Theories
7. සමාජ විද්‍යාත්මක න්‍යාය Sociological Theories
8. දේශපාලන සහ ආර්ථික න්‍යාය Political and Economic Theories

(Halsey & Johnston, 1988 , Pg.231-233)

## 1. ජීව විද්‍යාත්මක න්‍යාය (Bioligical Theories)

ජීව විද්‍යාත්මක න්‍යාය තුළ සාකච්ඡා කෙරෙන්නේ යුද්ධය කෙරෙහි ජීවී සැකැස්ම බලපාන ආකාරය යි. මෙම ජීව විද්‍යාත්මක න්‍යාය ප්‍රධාන ලෙස කරුණු 02 ක් මත පදනම් වේ.

> "පළමුවැන්න වන්නේ නො මැරී පැවැත්මේ නීතිය යි. ඒ අනුව පැළෑටිවල සිට මිනිසා දක්වා සමස්ත ජීවී සංහතිය ම තම ජීවිතය මිහිතලය මත තහවුරු කිරීමේ සටනක යෙදී ඇත. එහිදී අනුවර්තනය වීමට හැකි ජීවියා අනෙකුත් ජීවීන් සමග තරග කොට තම ජීවිතය මිහිතලය මත ස්ථාපිත කර ගනියි. දෙවැන්න වන්නේ මිනිසා ස්වභාව ධර්මයේ කොටසක් ලෙස සැලකූ අතර ආක්‍රමණශීලීත්වය ඔහුගේ සහජ ගති ලක්ෂණයක් ලෙස ඉස්මතු කිරීම යි" (Halsey & Johnston, 1988 , Pg.231-233)

නියැන්ඩතාල්ට පසුව බිහි වන බුද්ධිමත් මිනිසාට Homo Sapiens ඇත්තේ අවුරුදු විසිදහසක (20,000) නැතිනම් තිස්දහසක (30,000) ඉතිහාසයකි. පුද්ගලයාගේ ශරීරය තුළ ජෛව ඉන්ද්‍රිය පද්ධතිය සකස් වී ඇත්තේ ඔහු පරිසරයට අනුවර්තනය කරමිනි. දඩයම් යුගයේදී මිනිසාගේ ශරීරය සතුන් සමග සටන් කර ඔවුන් දඩයම් කිරීමේ ශක්තියෙන් යුක්ත විය. අනතුරුව එඬේර ජීවිතයට හුරු වෙමින් පසුව කෘෂිකාර්මික ජීවිතයකට හුරු විය. මානව සමාජය පරිණාමය වන්නේ මිනිසාගේ කායික ශක්තිය හා මානසික ශක්තියේ ක්‍රමික වර්ධනයත් සමග යි.

මෙම න්‍යායන්ට අනුව මිනිසාගේ සටන්කාමී හැසිරීම් තීරණය කරනු ලබන්නේ ස්වාභාවික තේරීම් මඟින් සංවිධානය කරන ලද කෝපය සහ ආක්‍රමණශීලී ක්‍රියාවන් මඟිනි. යුද්ධය හඳුන්වනු ලබන්නේ එවන් හැසිරීම් ප්‍රකාශ කරනු ලබන මාධ්‍යයක් ලෙසයි. ජීව විද්‍යාත්මක න්‍යාය ගොඩනැඟිය හැක්කේ සතුන්ගේ හැසිරීම් හා ජීවත් වන වටපිටාව පිළිබඳව අධ්‍යයනය කිරීමෙනි. විද්‍යාඥයන් තර්ක කරන ආකාරයට ස්වාභාවික වටපිටාව තුළ දේශපාලන හැසිරීම හා යුදමය තත්ත්වයන් හටගන්නේ මිනිසා තුළ පවතින ආක්‍රමණශීලී ස්වභාවය හේතුවෙනි.

මානව විද්‍යාඥයන්ට අනුව මිනිසාට කලබලකාරී හා ආක්‍රමණශීලී ස්වභාවය පුහුණු කර ඇත්තේ ස්වභාවයෙනි. එය සහජ ගති ලක්ෂණයකි. ආහාර සොයාගැනීමේදී, ආහාර බෙදගැනීමේදී හා භූමිය සම්බන්ධයෙන් මිනිස් සංහතියේ දඩයම් යුගයේ සිට සටන් පැවත ඇත. එසේ ම ජීව විද්‍යාත්මක පදනම මත ඇති වන වාර්ගික බෙදීම් ජනවාර්ගික අර්බුදය කෙරෙහි බලපායි. කළු-සුදු වර්ණභේද වාදය එවන් ජීව විද්‍යාත්මක පදන මත නිර්මාණය විය. මානව සමාජ සංවිධානය වඩාත් සංකීර්ණ භාවයට පත් වීමත් සමගම මෙම සහජ හැකියාවන් හා සහජයෙන් ලත් ආක්‍රමණශීලී හැසිරීම් මුල් කොටගෙන මිනිසා මිනිසාට ම එරෙහි ව අවස්ථාවට අනුරූප ව විවිධ ලෙස සටන් වැදුණි.

## 2. මනෝ විද්‍යාත්මක හා සමාජ මනෝ විද්‍යාත්මක න්‍යායන් **Psychological and Sociophychological Theories**

යුද්ධය පිළිබඳ මනෝ විද්‍යාත්මක සහ සමාජ මනෝ විද්‍යාත්මක න්‍යායන් මඟින් සමාජ කණ්ඩායම්වල බලපෑම අවධාරණය කරයි. යුද්ධය හටගන්නේ ජන සමූහයේ කෝපය හා කලබලකාරී මානසිකත්වය හේතුවෙනි. මිනිසා කුඩා කල සිට ම එම ආක්‍රමණශීලී සිතුවිලි තමන් තුළ ඇති බව විවිධ ක්‍රියාකාරකම් මඟින් ඔප්පු කරයි. එනම් වෛරය, ඉච්ඡාභංගත්වය වැනි මානසික අසහනකාරී සිතුවිලි එම ආක්‍රමණශීලී ක්‍රියාකාරකම් උත්පාදනයට අනුබල දෙයි. මානව කණ්ඩායම්වල හැසිරීම් රටාව අධ්‍යයනය කිරීමේදී එහි ප්‍රධාන අවස්ථා 04 ක් ඇත.

> "පළමු කොට ම කෝපකාරී ස්වභාවය බාහිර බලපෑමක් නොමැතිව ස්වාභාවික නිෂ්පාදනයක් ලෙස දක්නට ලැබේ. එනම් එය පරිණාමය වූ චරිතාංගයක් ලෙස දක්වයි. තනි පුද්ගලයකුගේ අභ්‍යන්තරයේ ඇති වන අසතුටුදයක සිතුවිලි ඉච්ඡාභංගත්වයන් හේතුවෙන් ඇති වන පීඩනය සමාජය තුළ ජීවත් වන අනෙකකු මත මුදා හැරීමෙන් සටන් ඇති වේ යන්න යි.
>
> දෙවනු ව මනෝ විද්‍යාත්මක හා සමාජ මනෝ විද්‍යාත්මක න්‍යායන්ට අනුව කලබලකාරී ස්වභාවයේ මූලාරම්භය තනි තනි පුද්ගලයාගේ ගති ලක්ෂණ යටපත්

කිරීම සමාජය විසින් අපේක්ෂා කරන බැවින් කෝපකාරී ස්වභාවය සමාජයේ කොටසක් ලෙස පසුකාලීන ව පරිවර්තනය වන අතර එම ප්‍රචණ්ඩ සිතුවිලි පදනම් කරගෙන ඇති වන ප්‍රචණ්ඩ ක්‍රියාවන් පාලනය කිරීමට ගන්නා උත්සාහය හේතුවෙන් ම යුදමය වාතාවරණයක් පැනනගී.

තුන්වෙනු ව සඳහන් කරන්නේ කෝපකාරී ගතිය ඉච්ඡාභංගත්වයේ නිෂ්පාදනයක් බවත්, එය මිනිසුන් තුළින් හටගන්නේ ඔවුන් බලාපොරොත්තු වන අවසාන ඉලක්ක ලබාගැනීමට නො හැකි වූ විට ය. මිනිසුන් ඉච්ඡාභංගත්වයට පත්වීමෙන් ඔවුන් කලබලකාරී ලෙස හැසිරීමට හැකි ය. යුද්ධයේ හැසිරීම ආයතනීකරණය කරන ලද රටාවක් ලෙස මෙහිදී හඳුන්වයි. ඒ අනුව යුද්ධය තනි පුද්ගලයාගේ මානසික ආතතීන්ට විසඳුම් ලබාදෙමින් ඔවුන්ට යහපත් චිත්තනයක් පවත්වාගෙන යාමට උපකාරී වන අතර පැනනගින අනෙකුත් අයහපත් ප්‍රතිවිපාක වළක්වයි.

අවසාන වශයෙන් හැසිරීම් පිළිබඳ ව විශේෂඥයන් දරන මතය වන්නේ සමූහයේ කලබලකාරී ගතිය සහජයෙන් එන්නක් නො වන බව යි. මනුෂ්‍යයන් ස්වභාවයෙන් කලබලකාරී නො වන අතර යටහත් පහත් ගතියෙන් ද යුක්ත නො වේ. ඔවුන් යුද්ධයට අකමැති වුව ද සාමකාමීද නො වේ. තමන් ජීවත් වන පරිසරය, ඉගෙනගන්නා දේ හා සමාජ සංස්කෘතික සංඝටකයන් මත සමාජය තුළ යුදමය වාතාවරණයක් නිර්මාණය වේ" (Halsey & Johnston, 1988 , Pg.231-233)

ඉහත කරුණු හතර විමර්ශනය කර බැලීමේදී පැහැදිලි වන්නේ මනෝ විද්‍යාත්මක සාධක සහ සමාජ සාධක එකතුව තුළින් නිර්මාණය වූ න්‍යායක් ලෙස මෙම න්‍යාය තහවුරු වී ඇති බව යි.

යුද්ධයට මනෝ විද්‍යාත්මක අර්ථකථනයක් ඉදිරිපත් කළ මනෝ විද්‍යාඥයකු වන කාල් යුංග් (Carl Jung) ඔහුගේ The Development Personality කෘතියේ සඳහන් කරයි. මින් පැහැදිලි වන්නේ යුද්ධය හුදෙක් පුද්ගල ආක්‍රමණශීලී මානසිකත්වය මත නිර්මාණය වූ බව යි.

### 3. මානව විද්‍යාත්මක න්‍යාය Anthropological Theories

මානව විද්‍යාත්මක න්‍යායන් පිළිබඳ සලකා බැලීමේදී සංස්කෘතිය යන සාධකය වැදගත් වේ. බොහෝ මානව විද්‍යාඥයන් යුද්ධය සංස්කෘතියේ නිෂ්පාදනයක් ලෙස හඳුනාගෙන ඇත. ඔවුන් සඳහන් කරන්නේ යුද්ධය සදකාලික සංසිද්ධියක් නොවන බව යි. මානව සමාජය විකාශනය වන්නේ සංස්කෘතික විපර්යාසයන් හේතු කොටගෙන ය. එලෙස සමාජ විකාශනය වන සන්ධිස්ථානවලදී ගැටුම් හටගැනීම ස්වභාවික ය. ඒ අනුව යුද්ධය ද විවිධ සංස්කෘතීන්ට අනුරූපව හටගෙන ඇත. එක් අතකින් සංස්කෘතිය යුද්ධය නිර්මාණය කරන අතර අනෙක් අතට යුද්ධය සංස්කෘතිය නිර්මාණය කරයි. තවත් අවස්ථාවන්හිදී සංස්කෘතික සංකීර්ණතාව තුළ හටගන්නා නව්‍යතාවන්ට අනුවර්තනය වීමට නොහැකි වීම මත යුද්ධය හටගනී. එසේ ම දේශපාලන සංස්ථාවෙහි ක්‍රමික වර්ධනය සහ බලයට ඇති කැමැත්ත මත ගැටුම් හටගනියි.

මේ අනුව පැහැදිලි වන්නේ යුද්ධයට බලපාන සංසිද්ධීන් අභ්‍යන්තර සංසිද්ධීන් මත පමණක් රඳා නො පවතින අතර එය මානව සමාජයේ දියුණුවත් සමග ඇති වූ මානව පරිණාමයේ ප්‍රතිඵලයක් බව ය. එසේ ම මානව සමාජයේ සංසිද්ධීන් යුදමය සංසිද්ධීන් සමග සම්බන්ධ වන අතර එය සංස්කෘතික පරිවර්තනයන්හි ප්‍රතිඵලයක් බවය. මානව විද්‍යාඥයන් පවසන්නේ යුද්ධයේ සාරය සංස්කෘතීන් අතර ගැටුමක් බව යි. ගෝත්‍ර අතර සිදු වුවත්, ජාතීන් අතර සිදු වුවත් යුද්ධය මානව සංස්කෘතීන්ගේ ස්වාධීනත්වයේ ප්‍රකාශනයක් බව මෙම න්‍යායෙන් තහවුරු වේ.

### 4. පරිසර විද්‍යාත්මක න්‍යාය Ecological Theories

පරිසර විද්‍යාත්මක න්‍යාය මෙහිදී වැදගත් වේ. මෙහි යුද්ධයට අවශ්‍ය වටාපිටාව පරිසරය මගින් නිර්මාණය කරයි යන්න ඔවුන්ගේ අදහස යි. පරිසරය සම්බන්ධ න්‍යායන් යුද්ධය සලකනු ලබන්නේ පාරිසරික වටාපිටාවක් සඳහා කරන සටනක එළිදැක්වීමක් ලෙස ය. සාම්ප්‍රදයික පරිසර විද්‍යාත්මක සම්ප්‍රාප්තිය වූයේ භූගෝල විද්‍යාත්මක පරිසරය ජාතීන්ගේ ප්‍රතිශතය තීරණය කරන අතර ඊට පසු අවස්ථාවල ගැටුම් ඇති කරමින් යුද කරන බව ය. එහිදී

ජීවත් වීමට සුදුසු ම පරිසරය තෝරාගැනීමට මිනිසා සටන් කරයි. නූතන පරිසරාත්මක න්‍යායන් පාරිසරික ගැටලු යුදමය අවස්ථාවන් බිහිකරලීමට හේතු වන බව යි. කාන්තාරයන් බිහි වීම, ජල සැපයීම් මාර්ග අඩු වී යාම, බෝග වගා විනාශ වීම වැනි කරුණු දේශපාලන අස්ථාවර බවත් සමාජ අසහනයත් ඉන් අනතුරුව සිවිල් යුද්ධ බවට පරිවර්තනය වන බව යි. එසේ ම නූතනයේ පරිසරය යුද්ධය කෙරෙහි කෙතරම් සමීප සම්බන්ධතාවක් දක්වන්නේ ද යන්න සොයා බැලීමේදී අද වන විට බැක්ටීරියා, දිලීර වැනි ක්ෂුද්‍ර ජීවීන් සතුරන් විනාශ කිරීම සඳහා යොදගැනීම සඳහන් කළ හැකි ය.

### 5. සදාචාර න්‍යාය **Moral Theories**

සදාචාර න්‍යාය යනු යුද්ධය සාමය සම්බන්ධ ආචාරධර්ම පිළිබඳ න්‍යායන්ගේ වඩාත්ම භාවිත වන බලපෑම් සහගත සංකල්පයක් බව ය. ඔවුන් සඳහන් කරන්නේ යුද්ධය පුද්ගලයා පරිපූර්ණ තත්ත්වයට රැගෙන එන බව ය. යුද භටයන් ගුණාත්මක හා විනයගරුක පිරිසක් ලෙස මොවුන් හඳුන්වන අතර ඔවුන් එසේ වන්නේ සාධාරණ දෙයකට සටන් කරන බැවිනි. පුරාතන ග්‍රීසියේ සහ රෝමයේ විශ්වාසය වනුයේ දෙවියන් වැනි වීරයකු වන්නට නම් යුද පිටිය පසු කර යා යුතු බව යි. එනම් සටන් වැදිය යුතු ය යන පදනම යි. ක්‍රිස්තියානි ආගම හා මුස්ලිම්වරුන් අතර ද මෙම අදහස් දක්නට ලැබුණු අතර කුරුස යුද්ධය හෙවත් ශුද්ධ යුද්ධය උදාහරණ ලෙස දැක්විය හැකි ය. කෙසේ නමුදු මෙම න්‍යාය සදාචාරමය මෙන් ම නීතිමය බොහෝ කරුණු වර්ධනය වීමට හේතු වී ඇත.

### 6. යුද තාක්ෂණික න්‍යාය **Military Theories**

යුද තාක්ෂණික න්‍යාය මඟින් යුදමය තාක්ෂණික ප්‍රවේශයක් ගෙන ඇත. හුදෙක් එය යුද තාක්ෂණික බලය මත පදනම් ව ඇත. න්‍යෂ්ටික අවි නිපදවීම, අත්හද බැලීම තුළ තම යුද ශක්තිය ජාත්‍යන්තරයට පෙන්වීමට ලෝක දේශපාලනය තුළ ඒ ඒ රටවල් මහත් උත්සාහයක් දරයි. ඒ අනුව යුද තාක්ෂණය හා තම රටවල් යුද අවිවල භාවිතය මඟින් ලෝක දේශපාලනය තුළ ප්‍රබලයා වීමට උත්සාහ දරයි.

## 7. සමාජ විද්‍යාත්මක න්‍යායන් Sociological Theories

සමාජ විද්‍යාත්මක න්‍යායන්හිදී සමාජමය සාධක යුදමය පසුබිම සඳහා බලපාන ආකාරය විග්‍රහ කරයි. එහිදී සමාජ පරිණාමවාදී න්‍යායේදී ලෝකයේ පරිණාමය සමග සමාජය පරිණාමය වූ අතර එම සිදුවීම තුළ ඇති වූ කායික හා චෛතසික සිදුවීම් සමාජමය වශයෙන් ප්‍රචණ්ඩත්වය හා කොල්ලකෑමේ චින්තනය අවදි කළේ ය. සට්ටනවාදීන් ප්‍රකාශ කරන්නේ,

> "ඩොන් මාටින්ඩේල්ට අනුව සට්ටන න්‍යාය ආරම්භ වන්නේ ක්‍රි. පූ. තුන්වන සියවසේ ජීවත් වූ කෞටිල්‍යය (Kautilya) නමැති පඬිවරයාගේ 'අර්ථ ශාස්ත්‍රය' (Arthasastha) නම් කෘතියේ එන විග්‍රහය අනුව ය. මින් පැහැදිලි වන්නේ සට්ටන න්‍යාය ආරම්භ වී ඇත්තේ ඉන්දියාව කේන්ද්‍ර කරගත් පෙරදිග චින්තනයකට අනුව ය" (කරුණාතිලක, 1998, පිටු අංකය 74)

මේ අනුව බලන කළ යුද්ධය සමාජ ගැටුමක් ලෙස සමාජ පරිණාමයේ මුල් යුගයේ සිට දක්නට ලැබුණි.

"සමාජ ගැටුම් විග්‍රහ කිරීමේදී සට්ටන න්‍යායට සම්බන්ධ නව මාක්ස්වාදී සමාජ විද්‍යාඥයකුගේ අදහස් සලකා බැලීම ද වැදගත් ය. ලෙවිස් කෝසර් සට්ටනය ප්‍රධාන කොටස් දෙකකට බෙදා දක්වා ඇත.

1. යථාර්ථවාදී ගැටුම (Realistic Conflicts)
2. යථාර්ථවාදී නො වන ගැටුම (Non Realistic Conflicts)

යථාර්ථවාදී ගැටුම යනුවෙන් අදහස් කරන්නේ පුද්ගලයන්ගේ සමාජ සම්බන්ධතාවන්හිදී විශේෂිත ඉල්ලීම් ඉටු නො වීම මත ගොඩනැගෙන ඉච්ඡාභංගත්වය හේතු කොට ගනිමින් ඇති වන ගැටුම් ය. මෙවැනි ගැටුම් සමාජයේ පැහැදිලි ව හඳුනාගත හැකි ය. පුද්ගලයන් අතර විවෘත ව ගොඩනැගෙන ගැටුම් වර්ගයක් ලෙස යථාර්ථවාදී ගැටුම් හැඳින්වීම යුක්ති සහගත ය. යථාර්ථවාදී නො වන ගැටම් සුලබව ඇති වන ගැටුම් වර්ගයක් නො වේ. එය ඇති වන්නේ පුද්ගලයාගේ තරගකාරී පරමාර්ථ මත ය. එහෙත් එම ගැටම් පුද්ගලයාට සීමා

වෙමින් ඔහු තුළ ඉච්ඡාභංගත්වය සහ විනීත භාවයක් ක්‍රියාවට නැගේ" (කරුණාතිලක 1998, පිටු අංකය 78)

මේ අනුව යුද්ධය පිළිබඳ සමාජ විද්‍යාත්මක න්‍යාය සමාජ සාධක මත පදනම් වී ඇත.

8. දේශපාලන සහ ආර්ථික න්‍යාය **Political and Economic Theories**

දේශපාලන හා ආර්ථික න්‍යායන් පිළිබඳ සලකා බැලීමේදී යුද්ධය සඳහා ප්‍රබල වශයෙන් බලපාන සාධකයන් දෙකක් ලෙස හැඳින්විය හැකි ය. මෙම න්‍යාය තුළ ප්‍රබල ප්‍රධාන න්‍යායන් කිහිපයක් අන්තර්ගත කරයි. එහිදී සදාචාරාත්මක න්‍යාය හා පරිණාමවාදී න්‍යාය වැදගත් වේ. සමාජ දේශපාලන ප්‍රවේශයේදී සමාජ විද්‍යාත්මක හා දේශපාලන විද්‍යාත්මක විශ්ලේෂණයක් සිදු කරයි. සමාජය පාලනය කරන කණ්ඩායම් මඟින් යුද තීරණ ගන්නා ආකාරය සිවිල් යුද්ධ දේශපාලන නායකයන්ගේ ක්‍රියා කලාපය සහ දේශපාලන හස්තයේ ක්‍රියාකාරිත්වය මෙමඟින් සොයා බලයි.

යුද්ධය පිළිබඳ ගොඩනැඟී ඇති මෙම න්‍යායන් මඟින් යුද්ධයට හේතු වූ සාධක පිළිබඳ ව අවබෝධයක් ලබාගත හැකි ය. උක්ත න්‍යායාත්මක පසුබිම අවධාරණය කරනුයේ Collier's Encyclopidia මඟිනි.

යුද්ධය පිළිබඳ ගොඩනැඟී ඇති මෙම න්‍යායන් පිළිබඳ ගැඹුරින් අවධානය යොමු කිරීමේදී පහත සඳහන් යුද න්‍යායන් හඳුනාගත හැකි ය.

1. සාධාරණ යුද න්‍යාය

යුද්ධය, සාමය සම්බන්ධ ආචාරධර්ම පිළිබඳ න්‍යායන්ගේ වඩාත් ම භාවිත වන බලපෑම් සහගත සංකල්පය සාධාරණ යුක්ති සහගත යුද න්‍යාය යි. ඔගස්ටයින් ඇක්වයිනාස්, ග්‍රොසස්, සුවාරිස් හා වික්ටෝරියා වැනි අය මෙහිදී ප්‍රමුඛ දර්ශනික කාර්යය ඉටු කළ අය වෙති. ඒ අතර හියුගෝ, ගෝසස් ප්‍රමුඛ ම දර්ශනික කාර්යය සිදු කරන ලදී. මෙලෙස ක්‍රමානුකූල ව සංවර්ධනය වූ සාධාරණ යුද න්‍යායේ සංකල්පයන් රැසක් සමකාලීන ජාත්‍යන්තරික නීතිවලට

හා හේග් හා ජිනීවා සම්මුති සම්පාදනය වීමෙහි ලා ප්‍රධාන කාර්යභාරයන් ඉටු කර ඇත. මේ තාරකා යුද්ධයට සම්බන්ධ සාදාචාරමය මෙන් ම නීතිමය බොහෝ කරුණු මේ හරහා වර්ධනය වී ඇත. සාධාරණ යුද න්‍යාය ප්‍රධාන කොටස් තුනක් ඔස්සේ සාකච්ඡා කරේ.

I. යුද්ධය ප්‍රකාශ කිරීම
II. යුද්ධය පවත්වාගෙන යාම
III. යුද්ධය අවසන් කිරීම

I. යුද්ධය ප්‍රකාශ කිරීම

මේ යටතේ වන නීතීන් අදළ වන්නේ රටේ රාජ්‍ය නායකයන්ට ය. රටක යුද හමුදව යුද්ධයක් සඳහා යොමු කිරීම සිදු කරන්නේ රාජ්‍ය නායකයා නිසා මේ සම්බන්ධයෙන් වගකිව යුතු වන්නේ ද රාජ්‍ය නායකයා ය. යම් රාජ්‍ය නායකයෙක් මේ රීතීන්ට එරෙහි ව කටයුතු සිදු කරයි නම් අදාළ රාජ්‍ය නායකයාට විරුද්ධ ව යුද අපරාධ සිදු කිරීම යටතේ වැරැදිකරුවකු බවට පත් වීමට සිදු වේ.

II. යුද්ධය පවත්වාගෙන යාම

මෙහිදී අදාළ වන්නේ යුද්ධය ආරම්භ වූ පසුව යුද භූමියේදී ක්‍රියාත්මක වන තත්ත්වයන් ය. මෙම කාරණාවට අදළ වන රීතීන් උල්ලංඝනය කිරීමේ වගකීම ඇත්තේ හමුදපතිවරුන් ඇතුළු සෙබළුන්ට ය. සාධාරණ හේතුන් මත ඇති වන යුද්ධ කෙසේ පවත්වාගෙන යා යුතු ද යන්න මෙමඟින් දක්වයි. එසේ නො කළහොත් යුද්ධය මෙහෙයවන හමුද නිලධාරීන් හා සෙබළුන් සාධාරණ හේතුන් නිසා යුද්ධය ඇති කළ පමණින් අසාධාරණ හා අයුක්ති සහගත ලෙස එම යුද්ධ පවත්වාගත නො හැකි ය. එය සාධාරණ අවසානයක් කරා පවත්වාගෙන යා යුතු ය. යුද්ධය පවත්වා ගෙන යන ක්‍රමවේදය ඕනෑ ම විධියක් නොවිය යුතු ය. විශේෂයෙන් ම යුද්ධ පවත්වාගැනීමේ දී විනාශය අවම කර ගැනීම මෙහි අරමුණ යි.

III. යුද්ධය අවසන් කිරීම

යුද්ධය අවසන් කිරීම නො කළ යුතු ද යන්න මෙම රීතිය මඟින් අදහස් වේ. එහිදී,

- අවසන් කිරීම සඳහා සාධාරණ හේතුවක් තිබීම යුද්ධය ආරම්භ කළ රටට සාධාරණයක් ඉටු නො වන පරිදි තත්ත්වය විසඳිය යුතු ය. අදාළ ආක්‍රමණශීලීත්වයට විරුද්ධ ව පීඩාවට පත් වුණු රාජ්‍යයන්ට සාධාරණයක් විය යුතු ය. රාජ්‍ය අසාධාරණකම් පැවැත්වීම පමණක් නොව සිදු කළ විනාශ කිරීම්වලට වන්දි ගෙවීමට සහ පුනරුත්ථාපන කාර්යයන් සඳහා ද එකඟ විය යුතු ය.
- නිවැරැදි අරමුණක් තිබීම තමන්ට යුද්ධය අවසන් කරන අවස්ථාව වන විට යුද්ධය ආරම්භ කිරීමට බලපෑ හේතුවලට පිළියමක් ලැබී තිබිය යුතු ය.
- යුද්ධයෙන් පසු යුද වන්දි හෝ යුද්ධයෙන් විනාශයට පත් වූ පාර්ශ්වයන්ට දඬුවම් ලබාදීමේ ක්‍රියාවලියේදී යුද්ධයට ඍජු ව සහභාගී වූ සහ නායකත්වය ලබාදුන් අයට මෙන් ම සාමාන්‍ය වැසියන්ට ද එක හා සමාන ව දඬුවම් ලබාදීම නිවැරැදි නො වන අතර ඔවුන් එක හා සමාන ව නො සැලකිය යුතු ය.
- අදාළ පාර්ශ්වයන් යුද්ධය ආරම්භ කිරීමෙන් යම් හානියක් සිදු කළේ නම් ඊට සමානුපාතික ව ඔවුන්ට වන්දි ගෙවීමට සිදු විය යුතු ය.

සාධාරණ යුද න්‍යායේ අවස්ථාවන් ප්‍රධාන වශයෙන් වර්තමාන යුද ආචාර ධර්ම වර්ධනයෙහි ලා හේතු වී ඇති අතර මෙමඟින් තවදුරටත් යුද්ධ ඇති වීම ආරම්භ වීම වැළැක්වීම සහ රාජ්‍යයන් අධෛර්යවත් කිරීමට උත්සාහ දරයි.

### 2. යථාර්ථවාදය පිළිබඳ යුද න්‍යාය

ජාත්‍යන්තර සම්බන්ධතා හා ගැටුම් අධ්‍යයනය පිළිබඳව විද්‍යාර්ථීන් අතර පිළිගත් හා මුල් බැසගත් න්‍යාය සම්ප්‍රදය වන්නේ යථාර්ථවාදය යි. යථාර්ථවාදයේ න්‍යාය සහ තත්ත්ව වඩාත් සංකීර්ණ වුව ද ඔවුන් විසින් ජාත්‍යන්තර සම්බන්ධතාවලට නීතිය, යුක්ති සහගතභාවය වැනි සදචාරාත්මක සංකල්පය යොදගැනීම කොතෙක් දුරට ගැළපේ ද යන්න සැකයක් වේ. යථාර්ථවාදීන් පවසන්නේ ජාත්‍යන්තර තලයේ රාජ්‍යයක හැසිරීම් තීන්දු කිරීම සඳහා සදචාරාත්මක සංකල්පය විස්තරාත්මක හෝ විධායක යන

කුමන ආකාරයෙන් වුව ද නො හැකි බව යි. ඔවුන් ඒ වෙනුවෙන් වැඩි බලයක් තබන්නේ ආරක්ෂාව හා බලය නමැති කරුණු දෙකට යි. ජාත්‍යන්තර තලයෙහි අපැහැදිලි සහ අවිචාරවත් තත්ත්වයක සදාචාරාත්මක ගනුදෙනුව සිදු කළ නො හැකි බව ඔවුන්ගේ දර්ශනයෙහි හරය යි.

### 3. අහිංසාවාදය

අහිංසාවාදීන් යුද්ධයට වඩා සාමයට කැමැති ය. සාමය ඇති කිරීම වෙනුවෙන් යුද්ධ කිරීම යන දර්ශනික සංකල්පය කිසි සේත් ම තාර්කික නො වන බවට මොවුහු තර්ක කරති. සාමකාමී අවසන් ප්‍රතිඵලයට විශාල විනාශයක් කරන්නේ කෙසේ ද යන්න ඔවුන්ගේ තර්කය යි. එම නිසා කිසි සේත් ම යුද්ධ කිරීම යුක්ති සහගත ලෙස සැලකිය නො හැකි ය. අහිංසාවාදයට විරුද්ධ ව ඉදිරිපත් කළ තර්කය වන්නේ ඔවුන් රාජ්‍යයක සියලු ම අයිතීන් භුක්ති විඳ යුද්ධවලදී ඒවාට එරෙහි වීම යුක්ති සහගත නොවන බවයි. තමන්ගේ සදාචාර පිරිසිදු බව වෙනුවෙන් තම වගකීම් පැහැර හරින පිරිසක් බවටත් හඳුන්වාදෙන විචාරකයෝ එමගින් ඔවුන් සතුරන්ට යම් ආකාරයක සහායක් ලබාදෙන බව පිළිගනිති.

ඓතිහාසික ව බලන කල යුද සමයන්හි ඒවාට සහභාගි වීමට විරෝධය පළ කළ බොහෝ අහිංසාවාදීන් සිර දඬුවම් ලැබූ අතර දේපළ රාජසන්තක වීම හා තම ජීවිතයෙන් වන්දි ගෙවීමට සිදු වී ඇත. අහිංසාවාදීන්ට අනුව 'සිවිල් නීති කඩකිරීම හා ප්‍රචණ්ඩ නොවූ විරුද්ධ වීම්' ඉතා ප්‍රචණ්ඩ සතුරකු හමුවේ කෙතරම් දුරට ප්‍රයෝජනවත් දැයි පෙන්වා ද ඇත. බ්‍රිතාන්‍යයෙන් ඉන්දියාව නිදහස් කරගැනීමට හැකි වූයේ මහත්මා ගාන්ධිගේ ප්‍රධානත්වයෙන් අවිහිංසාවාදය ක්‍රියාත්මක කිරීමෙනි.

### 4. ගරිල්ලා යුද න්‍යාය

ගරිල්ලා යුද උපක්‍රම ප්‍රධාන වශයෙන් ම සමන්විත වන්නේ පළමු ප්‍රවේශය (Cottensive Action) ගන්නා අයට යි. ගරිල්ලන් ප්‍රධාන වශයෙන්ම ජංගම වීම, සැඟවුණු, බලාපොරොත්තු නොවූ අවස්ථාවකදී පහර දීම සිදු කිරීම ආදී ලක්ෂණ ගනී. ඒ හැරුණු විට සිවිල් පිරිස් වෙතින් ලැබෙන ආධාර, බාහිර අනුග්‍රහයන් හා දේශපාලන දැක්මක් සහිත පිරිසක් වේ.

"නවීන ලෝකයට මේ පැරණි සටන් ක්‍රමය ප්‍රායෝගික ව මෙන් ම න්‍යායාත්මක ව ද හඳුන්වාදීමට පෙරමුණ ගත්තේ කොමියුනිස්ට් විප්ලවවාදීන් ය. ලෙනින් එය කම්කරුවන්ගේ සටන් ක්‍රමය ලෙසද පැවසී ය. මාඕ සේතුං තම විප්ලවයේදී ප්‍රධාන වශයෙන් යොදාගත්තේ පිටිසර පළාත්වල සිට ගරිල්ලා ප්‍රහාර සතුරු කඳවුරුවලට එල්ල කිරීම යි. කියුබාවේ චේ ගුවේරා මෑත යුගයේ බිහි වූ ගරිල්ලා සටන් ක්‍රමය පිළිබඳ මනා ප්‍රවීණයකු වශයෙන් සලකනු ලබන්නෙකි. ආරම්භයේදී ගරිල්ලා සටනට වඩා යෝග්‍යය වන්නේ ග්‍රාමීය ප්‍රදේශ යැයි ඉහත දැක්වූ සටන්කරුවෝ සිතුහ. එමගින් ගොවි ජනතාව ඊට සහභාගී කරගත හැකි වීම වාසියක් වේ. නගරවල සතුරු මධ්‍යස්ථානවල ද ගරිල්ලා ප්‍රහාර එල්ල කළ යුතු යැයි චේ ගුවේරා පැවසී ය. එහෙත් ඒවා එල්ල කළ යුතු වන්නේ නගරයෙන් බැහැර සිට ය." (බාලසූරිය, 1998, පිටු අංකය 51)

ගරිල්ලන්ගේ සාර්ථකත්වය, ක්‍රියාකාරිත්වය සහ පැවැත්ම සනාථ වන්නේ සමාජයේ භෞතික සහයෝගය සහ මානසික සහයෝගය මත යි. ප්‍රාදේශීය සමාජය බොහෝ විට ප්‍රතිගරිල්ලා කණ්ඩායම් මගින් පීඩාවට පත් වෙති. ගරිල්ලන්ට උදවු උපකාර කරන පිරිසට දේපළ විනාශ වීම්, ජීවිත හානි, සිරගත වීම්, ප්‍රදේශවලින් ඉවත් වීමට සිදු වීම ආදියට මුහුණදීමට සිදු වන නමුත් ප්‍රදේශීය සමාජය ගරිල්ලන්ට හොඳ ප්‍රතිචාර දක්වන්නේ නම් එවැනි දරුණු ප්‍රතිවිපාක විඳීමට සිදු නො වේ.

බාහිර උදවු උපකාර ලැබෙන විට ගරිල්ලෝ වඩාත් සාර්ථක ව ක්‍රියාත්මක වෙති. ගරිල්ලා යුද උපක්‍රමය හමුදමය වනවාට වඩා දේශපාලනික පැත්තට වැඩි බරක් ඇත. උපාය මාර්ගික ව හා දේශපාලනික අරමුණක් ක්‍රියාත්මක වන බැවින් යුදමය ක්‍රියාව එහි කොටස් ලෙස ක්‍රියාත්මක වෙයි. බොහෝ විට පීඩාකාරී රජයකට විරුද්ධ ව ගරිල්ලා සටන් ක්‍රමය හඳුනාගත හැකි ය.

යුද න්‍යායන් පිළිබඳව සාකච්ඡා කිරීමේදී ප්‍රධාන වශයෙන් ඉහත යුද න්‍යායන් දැක්විය හැකි ය. අනෙකුත් නිශ්චල දේවල්ද ජාත්‍යන්තර ක්‍රම පද්ධතීන් අරාජික බව යුද්ධය හේතුවෙන් ඇති

විය. මානව සමාජයේ පුද්ගල ක්‍රියාවන් මැනිය හැකි ප්‍රමාණය මත මෙම න්‍යායන්ට මූලබීජ සැපයිණි. මේ අනුව යුදමය ක්‍රියාවන් බිහි වීමට පදනම් වූ හේතු සහ එම ක්‍රියාවන්ගේ ස්වභාවය මත යුද න්‍යායන් හඳුනාගත හැකි ය.

## ශ්‍රී ලංකාවේ ජනවාර්ගික අර්බුදයේ පසුබිම සහ ඇතිවීමට හේතු

ජනවාර්ගික අර්බුදය අධ්‍යයනය කිරීමේදී පළමුවෙන් ම ජන වර්ගයක් කෙසේ නිර්මාණය වන්නේ ද යන්න අධ්‍යයනය කිරීම වැදගත් වේ. එහි සම්භවය මානව සමාජ විද්‍යාව තුළ හඳුනාගත හැකි ය. මීට වසර දශලක්ෂ ගණනාවකට පෙර වානර යුගය දක්නට ලැබුණු අතර, අනතුරුව එළඹෙන ආදි මානව යුගය මීට වසර 20,000 සහ 30,000 ක් ඈතට දිව යයි. ස්වාභාවික පරිසරය හා බද්ධ වූ ජීවිතයක් ගත කළ අතර, ඔවුහු හුදෙකලා ජීවිතයක් ගත කිරීමට උත්සාහ ගත්හ. ආදි මානවයා පුද්ගලාන්තර සම්බන්ධතා ශක්තිමත් කරමින් සාමූහික ජීවන රටාවකට අනුගත වීමත් සමග ම සමාජ පරිණාමයේ ප්‍රබල සන්ධිස්ථානයක් පසු කළේය. මීළඟට එළඹෙන්නේ ගෝත්‍රික යුගය යි. ගෝත්‍ර මානවයා පොදු ජීවන රටාවකට අවතීර්ණ වීම තුළ රාජ්‍ය සංකල්පය මතු විය. විවිධ සංස්කෘතීන් හා විවිධ ආගමික විශ්වාසයන්ගේ ප්‍රභවයට හා විකාශයට මෙම යුගය දැඩි බලපෑමක් කළේ ය. අනතුරුව ගෝත්‍ර කිහිපයක් එකතු වීමෙන් ජන වර්ග බිහි විය. මෙලෙස මානව සමාජය විකාශනය වූ අතර 19 වන සියවස වන විට විවිධ මානව වර්ග උදෙසා විවිධ සම්භවයන් ඇති බවත්, ඔවුන් ලෝකයේ විවිධ කලාපවල එකිනෙකට වෙනස් අන්දමේ කායික සාධක මත පරිණාමයට ලක් ව ඇති බවත් විද්‍යාඥයන් විසින් තහවුරු කරන ලදි. වර්ගයක් යන්න මිනිසුන් අතර පවත්නා ජීව විද්‍යාත්මක බෙදීම් මත නිර්මාණය වූවකි. බ්‍රිතාන්‍ය මානව විද්‍යාඥයකු වන ඈෂ්ලි මොන්ටේගු පෙන්වා දෙන්නේ විවිධ වාර්ගික කණ්ඩායම් දෙදහසක් පමණ එකිනෙකට මිශ්‍ර වීමෙන් ජන වර්ග නිර්මාණය වී ඇති බව යි. කෙසේ වුව ද ප්‍රධානතම වර්ග තුනක් වන කොකේසියානු, මොංගෝලියානු සහ නීග්‍රොයිඩ් යන මානව වර්ගය මානව සම්භවයේ මුල් ම මානව වර්ගය යැයි සරල ව නිර්වචනය කළ හැකි ය.

"වර්තමානයේ පවා මෙම මානව වර්ග වෙන් ව හඳුනාගත හැකි අතර ඔවුනොවුන්ගේ උස, මහත, කෙස්වල වර්ණය සහ ස්වරූපය, නළල් තලයේ ස්වභාවය, ශරීරයේ රෝම වැවී ඇති ආකාරය ආදි ජීව විද්‍යාත්මක සාධකවල වෙනස්කම් මත මෙකී මානව වර්ග වෙන් වෙන්ව හඳුනාගත හැකි ය" (කරුණාතිලක, 2007, පිටු අංකය 104)

දකුණු ආසියාවේ ජීවත් වන බොහෝ මිනිසුන් මොංගෝලියානු සහ නිග්‍රොයිඩ් යන මානව වර්ග දෙක අතර ඇති වූ සංකලනයකි. එහිදී සමාජ සංස්කෘතික වෙනස්කම් දැකිය හැකි ය. කොකේසොයිඩ් සහ නිග්‍රොයිඩ් යන මානව වර්ග දෙකක් අතර ඇති වූ ගැටුම දකුණු අප්‍රිකාවේ පැවති කළු- සුදු භේදය නිර්මාණය කළේ ය.

මේ අනුව වර්ගයක් යනු කායික සාධක පදනම් කරගෙන කරනු ලබන බෙදීමකි. එහෙත් ජනවර්ගයක් යනු සමාජ සංස්කෘතික වශයෙන් බෙදී සංවිධානය වී සිටින කණ්ඩායමකි. එහිදී ඔවුන්ගේ භාෂාව, ආගම, ඇඳුම් පැලඳුම්, සිරිත් විරිත්, ඇදහිලි, විශ්වාස ආදිය කේන්ද්‍ර කර ගනිමින් එකිනෙකා ප්‍රජාවක් නැතහොත් කණ්ඩායමක් වශයෙන් බෙදී සිටීම ජනවාර්ගිකත්වය යැයි හැඳින්විය හැකි ය. ඉරානයේ කුර්දිෂ් හා සුන්නි මුස්ලිම්වරු අතර පවතින්නේ වාර්ගික බෙදීමක් නොව ජනවාර්ගික බෙදීමකි. ලංකාවේ සිංහල, ද්‍රවිඩ ජන කොටස් අතර ද පවතින්නේ ජනවාර්ගික අර්බුදයකි.

ජන වර්ගයක් තීරණය වීම සඳහා ඔවුන්ගේ කේන්ද්‍රීය ඇගයුම් (Core Values) බලපායි. පොදු ආගමක්, භාෂාවක්, සමාජීය හා සංස්කෘතික සිරිත් විරිත්, ඇදහීම් හා විශ්වාසයන්, අධ්‍යාපන ක්‍රමෝපායන් හා බුද්ධි ගවේෂණයන් ආදිය සහ නිශ්චිත භූමි ප්‍රදේශයක් ඇතුළත වර්ෂ ගණනාවක් තුළ එකට ජීවත් වීම මගින් පූර්ණ ජන වර්ගයක් නිර්මාණය වෙයි. මේ අනුව ඔවුන්ගේ සංස්කෘතිකාංග ඔවුන්ගේ අනන්‍යතාව තහවුරු කරයි. ජන වර්ග දෙකක් අතර ඇති වන ගැටුම ලෙස ද හැඳින්විය හැකි ය.

මෑතකදී වර්ගය, ජනවාර්ගික බව පිළිබඳව බොහෝ සෙයින් අවධානය යොමු වී ඇත.

"අමෙරිකා එක්සත් ජනපදයේ (Ethnic) ජනවාර්ගික යන්න යොදගෙන ඇත්තේ (Racial) වර්ගීකරණයට විකල්පයක් වශයෙනි. එය පෙර කාලයේදී යොදගත් අන්දම පිළිබඳව ප්‍රශ්න මතුවී තිබේ. Ethnos යන වචනය හෙරඩෝටස් සහ ඇරිස්ටෝටල්ගේ කාලය දක්වා දිව යයි. මෙය ග්‍රීසියේ යොදාගෙන ඇත්තේ කණ්ඩායමක් යන්නට යි. ලංකාවේ සිංහල හා දමිළ ජන වර්ග පිළිබඳ අවබෝධය වැදගත් ය. එහෙයින් ජන වර්ග පිළිබඳ හැඳින්වීම මෙහි අර්ථය යි. ජාතිය (Race) යනුවෙන් සාමාන්‍යයෙන් හැඳින්වෙන්නේ ජනානුදර්ශිය (Genotypical), රූපානුදර්ශිය (Phonotypical) ලක්ෂණ ය. ජනානුදර්ශිය යනු උප්පත්තියෙන් ඇති වූ විවිධ ලක්ෂණයන් සහ පරිසරය මඟින් පෙන්නුම් කරන ලක්ෂණ ය. මේවායින් පෙන්වන්නේ වර්ගය යනු සහජයෙන් ඇති ලක්ෂණත්, පරිසරය අනුව ඔවුන්ගෙන් පෙනෙන විවිධ චරිත ලක්ෂණ අයිති, විවිධ ජන කොටස්වලට අයිති මිනිසුන්ගේ වෙනස්කම් ය." (රත්නායක, 2001, පිටු අංකය 14)

ලුවිස් වර්ත් නම් සමාජ විද්‍යාඥයා සුළු ජාතිය සහ මහ ජාතිය නිර්වචනය කරන්නේ මෙසේ ය. එනම්,

"අප සුළු ජාතිය නිර්වචනය කරනු ලබන්නේ සමාජයේ සෙසු අයට සාපේක්ෂ ව වෙන් ව ස්වකීය භෞතික හෝ සංස්කෘතික ලක්ෂණයන් පවත්නාගනු ලබන්නා වූ පුද්ගල කණ්ඩායමකට ය. එහිදී ඔවුන් වෙනස් සහ අසමානතා සැලකිලිවලට සහ ඒ නිසාම සෙසු අයගෙන් සාමූහික නො සලකා හැරීමකට මූලික වන කණ්ඩායමක් යම් සමාජයක් තුළ ජීවත් වීමෙන් ගම්‍ය වන්නේ මහ ජාතිය නැතහොත් ප්‍රධාන ජාතිය තමන්ගේ ඉහළ සමාජ ගරුත්වය සහ වරප්‍රසාද භුක්ති විඳින්නා වූ කණ්ඩායමක් බවට පත් වෙයි. ඒ අනුව සුළු ජාතීන්ගේ සමාජ තත්ත්වය සමාජයේ පොදු ජීවන රටාවෙන් බැහැර වූ සහභාගිත්වය අතින් අවම වූ ක්‍රියාවලියක් බවට පත් වේ. එපමණක් නොව ඔවුන් අත්‍යවශ්‍යයෙන් ම හුදෙකලා

වූ කණ්ඩායමක් බවට පත් ව සෙසු අයගෙන් වෙන් ව සැලකිල්ලට සහ අවධානයට ලක් වන කණ්ඩායමක් බවට පරිවර්තනය වේ. (කරුණාතිලක, 2007, පිටු අංකය 105-106)

සුළු ජාතිය මත මහ ජාතිය එල්ල කරන පීඩනය හේතු කොටගෙන ඔවුන් ගැටුමක් නිර්මාණය කරගනියි. සුළු ජාතිය යන පිරිසට රටක මානව වර්ග, ජන වර්ග, පමණක් අයත් නො වන අතර, සම්පත්, බලය, වරප්‍රසාද සහ අයිතිවාසිකම් භුක්ති විඳීම අතින් ඕනෑ ම මානව සමාජයක සුළු ජාතීන් වශයෙන් පෙනී සිටින තවත් සමාජ කණ්ඩායම් කිහිපයක් හඳුනාගත හැකි ය. එනම් ළමයින්, කාන්තාවන්, වයෝවෘද්ධ පුද්ගලයන්, පහළ කුලවල සාමාජිකයන්, නූගතුන්, දේශපාලනික කණ්ඩායම්, කුඩා ආගමික සමූහ, කම්කරුවන් යනුවෙනි. ජන වර්ගයන් අතර මෙවන් ගැටුමක් නිර්මාණය වීමට සාධක කිහිපයක් වැදගත් වේ. ලංකාවේ ජනවාර්ගික අර්බුදය සුළු ජාතීන්ගේ ප්‍රශ්නයක් ලෙස බොහෝ විචාරකයෝ විස්තර කරයි. ඒ සඳහා වැදගත් වන සංකල්පමය හා න්‍යායාත්මක රාමුවක් ඇත.

1. තරගකාරිත්වය සහ සමාජ ඉඩ ප්‍රස්තාව (Competition and Social Opportunities)
2. මානව කේන්ද්‍රණවාදය (Ethno- Centrism)
3. පූර්ව මත, සැකය හා නො සලකා හැරීම (Prejudices, Suspicions and Discriminations)
4. ජාතිය, රාජ්‍යය සහ නිජබිම (Nation, State and Homeland)
5. අධිපතිවාදී පෞරුෂය (Authoritarian Personalities)
6. ඉච්ඡාභංගත්වය සහ සැහැසි බව (Frustration and Aggression)
7. දෙමළ ජාතීන්ගේ එකමුතුව නැතහොත් හවුල (Tamil Diaspora)
8. ගැටුම නැතහොත් යුද්ධය (Conftict - War)

(කරුණාතිලක, 2007, පිටු අංක 107-108)

ඊනෑ ම සමාජයක මහ ජාතියට සාපේක්ෂ ව සුළු ජාතිය සමාජ ඉඩ ප්‍රස්තාව ලබාගැනීම සඳහා තරග කරයි. එහිදී තනි ව හෝ කණ්ඩායමක් වශයෙන් සමාජ අවස්ථාවන් ලබාගැනීමට අරගල කරයි. අධ්‍යාපන අවස්ථා මඟින් පහසුවෙන් උඩුකුරු සංචලතාවක් ළඟා කරගත හැකි බැවින් සමාජ ඉඩ ප්‍රස්තාව ඒ හරහා ලබාගැනීමට කටයුතු කරයි. ද්‍රවිඩයන්, පෘතුගීසි, ලන්දේසි යුගයේ විශේෂයෙන් ම ඉංග්‍රීසි අධිරාජ්‍යවාදී යුගය තුළ සමාජ අවස්ථාවන් ලබාගැනීමට උත්සාහ කරන ලදී. අධිරාජ්‍යවාදී යුගය තුළ හඳුන්වා දුන් ව්‍යවස්ථා සංශෝධන සහ නිදහසින් පසු ආණ්ඩු බලය ලබා ගත් පක්ෂ හා නායකයන් විසින් ගත් ක්‍රියා මාර්ග සුළු ජාතිකයන් අපේක්ෂා කළ අයුරින් සමාජ ඉඩ ප්‍රස්තාවන් නො ලැබී යාමට හේතු විය. ඒ අනුව ජනවාර්ගික අර්බුදය සුළු ජාතීන්ගේ අර්බුදයක් ලෙස ගොඩනැගිණි.

තමන්ගේ ජන වර්ගය, භාෂාව, ආගම සහ සෙසු සංස්කෘතික විචල්‍යයන් උසස් කොට සැලකීම හා ඊට සාපේක්ෂ ව සෙසු ජන වර්ග සහ ඔවුන්ගේ සංස්කෘතීන් පහත් කොට සැලකීම මානව කේන්ද්‍රණවාදය නම් සුවිශේෂී මනෝ විද්‍යාත්මක තත්ත්වය යි. ඊනෑ ම රටක මහ ජාතිය මෙන් ම සුළු ජාතිය ද මෙම මානසික තත්ත්වය අනුව ක්‍රියා කරයි. මෙම තත්ත්වය මත එකිනෙකා නො සලකා හැරීම පිළිබඳව දරන අදහස් ජනවාර්ගික අර්බුදයට හේතුවක් විය.

පූර්ව මතය යම් කණ්ඩායමක් හෝ ප්‍රජාවක් තුළ ජීවත් වන ජනතාව සම්බන්ධයෙන් අල්ප හෝ නිවැරැදි නො වන තොරතුරු මත පදනම් වෙමින් ගොඩනගා ගනු ලබන නිෂේධනාත්මක හා අඛණ්ඩ, ඉදිරියට ගෙන යනු ලබන්නා වූ විනිශ්චයකි. සිංහල, ද්‍රවිඩ තරගකාරීත්වය මත කල්පනා කරන්නේ ද්‍රවිඩයන් තමන් අබිබවා යාමට කටයුතු කරන බව යි. සුළු ජාතිය තම ජාතියේ අනන්‍යතාව වෙනුවෙන් යම් ක්‍රියාමාර්ගයක් ගැනීමේදී හෝ එසේ කටයුතු කිරීමේදී සිංහල ජාතිය කල්පනා කරන්නේ ද්‍රවිඩයන් තමන් විනාශ කරන්නට හෝ තම රට අල්ලාගැනීමට කටයුතු කරන බව යි. මෙය සැක උපදවාගැනීමකි. මෙවැනි පූර්ව මත හා සැකය මත ජනවාර්ගික ගැටුම් ඇති විය.

ජාතිය, රාජ්‍යය සහ නිජබිම යන සංකල්පයන්ගෙන් පැහැදිලි වන්නේ එක් ජාතියකට එක් රාජ්‍යයක් යන අදහස යි. මෙය බටහිර

බුද්ධිමය පුනරුදයෙන් පසුව ගොඩනැගුණු සංකල්පයකි. එසේ ම එය බටහිර අධිරාජ්‍යවාදයේ ව්‍යාප්තිය සමග පැතිරිණි. මෙය ජාතික රාජ්‍ය සංකල්පය වේ. නූතන ජාතික රාජ්‍යයක ලක්ෂණ කිහිපයක් දැකිය හැකි ය. එක් ජාතියකට එක් රාජ්‍යයක්, භූමිය, ජනගහනය, ආණ්ඩුව, ස්වාධිපත්‍ය යන ලක්ෂණ ක්‍රියාත්මක වීම, ආභ්‍යන්තරික සහ බාහිර ස්වාධිපත්‍යයක්, මධ්‍යගත පාලනය, තිලබල ක්‍රමය යනාදියයි. ජාතිවාදී හැඟීම් ඉස්මතු වීමට මෙම සංකල්පය බලපෑම් කරයි. චෙල්වනායගම් නම් ද්‍රවිඩ නායකයා පනහට පනහ ඉල්ලීම් මතු කළේ තම ජාතියේ වරප්‍රසාද ලබාගැනීමට ය. එසේ ම ඔවුහු උතුරු නැගෙනහිර ප්‍රදේශවල තමන්ගේ නිජබිම ලෙස පැවතුණේ ය යන න්‍යාය ධර්මය මතුකර ගැනීමට උත්සාහ ගනී. ඒ සඳහා එම සංවිධානයේ ප්‍රධාන උපදේශකයා වන ඇන්ටන් බාලසිංහම් විසින් ජාත්‍යන්තර වශයෙන් නිජබිම් සංකල්පය ප්‍රචලිත කිරීමට උත්සාහ ගත් බැවින් ඔහු 'න්‍යායාචාර්ය' යන ගෞරව නාමයෙන් පිදුම් ලැබී ය.

අධිපතිවාදී පෞරුෂය යනුවෙන් අදහස් කරන්නේ තම ප්‍රජාවට හෝ කණ්ඩායමට ආකර්ෂණීය නායකත්වයක් සහ ඒ ඔස්සේ විවිධ අපේක්ෂාවන් සහ මතවාදයන් ගොඩනගමින් කටයුතු කිරීම යි. මෙහිදී මහ ජාතිය නියෝජනය කළ බණ්ඩාරනායක ආධිපත්‍ය, සුළු ජාතිය නියෝජනය කළ චෙල්වනායගම්ගේ අධිපතිවාදී පෞරුෂය, මහ ජාතිය නියෝජනය කරන මහින්ද රාජපක්ෂ මහතාගේ අධිපතිවාදී පෞරුෂය හා සුළු ජාතිය නියෝජනය කළ වේලුපිල්ලේ ප්‍රභාකරන් විසින් කොටි සංවිධානයේ බලය අතට ගැනීම දැකිය හැකි ය. කෙසේ නමුදු 70 දශකයේ සිට ඇතිවූ මෙම අධිපතිවාදී නායකත්වය තුළ උත්තේජනය වූ ද්‍රවිඩ ජනතාව ද තම අයිතිවාසිකම් ලබාගැනීමට සක්‍රීයත්වයෙන් දයක ව ඇත.

ජනවාර්ගික අර්බුදයක් ඇති වීමට මීළඟ හේතුව ඉච්ඡාභංගත්වය සහ සැහැසි බව යි. මෙය මනෝ විද්‍යාත්මක සහ සමාජ විද්‍යාත්මක පදනමක් වන අතර මෙම පීඩනයට ගොදුරු වූ සියල්ල ම සැහැසි ලෙස තම පීඩනය මුදා හරී. දෙමළ ජාතීන්ගේ එකමුතුව නැතහොත් හවුල ද්‍රවිඩ ප්‍රචණ්ඩ දේශපාලනයේ තවත් ප්‍රබල සමාජ සංසිද්ධියකි. ලෝකයේ දියුණු නොදියුණු සෑම රටක ම පාහේ ද්‍රවිඩ ජාතිකයන් විශාල සංඛ්‍යාවක් විවිධ වෘත්තීන්හි නිරත

වී සිටින අතර ඔවුහු තම ජන වර්ගයා වෙත මානව කේන්ද්‍රණවාදී පදනමකින් සහයෝගය දක්වති. ඒ තුළ ද්‍රවිඩයන් සුළු ජාතිකයන් ලෙස ශක්තිමත් තම අරගලය දියත් කර ඇත.

මතවාදී ගැටුමක් ලෙසින් 29 වන සියවසේ මැද භාගයේ දී දක්නට ලැබුණු මෙම ගැටුම ආයුද සන්නද්ධ ගැටුමක් බවට පත්වූයේ 1980 දශකයේ මුල් භාගයේ ය. 1980 න් පසුව ඇතිවූ ගැටුමට සම්බන්ධ වූ ඍජු පාර්ශ්ව දෙක වන්නේ ශ්‍රී ලංකා රජය සහ විමුක්ති කොටි සංවිධානය (එල්. ටී. ටී. ඊ. සංවිධානය)යි. ශ්‍රී ලංකා ආණ්ඩුව සහ දෙමළ ප්‍රජාව අතර ඇති වී ඇති මෙම ගැටුම ආරම්භ වන්නේ ද්‍රවිඩයන් විසින් උතුරු- නැගෙනහිර පළාත්වල ප්‍රාදේශීය ස්වායත්තතාව ලබාදෙන ලෙස කරන ලැබූ ඉල්ලීම සමග ය. ශ්‍රී ලංකාව නිදහස් රාජ්‍යයක් වීමෙන් අනතුරුව දෙමළ ජනතාවගේ අරමුණ වූ ෆෙඩරල් රාජ්‍යයක් පිළිබඳ ඉල්ලීම් දක්වා වෙනස් විය.

"ශ්‍රී ලංකාවේ ජනවාර්ගික ගැටුමේ විකාශනය ප්‍රධාන යුග තුනක් යටතේ අධ්‍යයනය කළ හැකි ය.

i. ගැටුමේ පූර්ව අවස්ථාව :- 1970 ට පෙර යුගය
ii. ගැටුමේ වර්ධනීය අවස්ථාව :- 1970 මැද භාගයේ සිට 1983 දක්වා යුගය
iii. අර්බුදය සහ ප්‍රතිවිපාක අවස්ථාව :- 1983 න් පසු යුගය"

(දික්වැල්ල, ප්‍රියන්ත සහ හෙට්ටිආරච්චි, 2003, පිටු අංකය 249)

නිදහස ලැබීමෙන් අනතුරුව ශ්‍රී ලංකාවේ රාජ්‍ය ක්ෂේත්‍රය තුළ සිංහල නො වන ජන කොටස්වල අභිලාෂයන් නියෝජනය නො වීමේ හෝ බැහැර කිරීමේ ප්‍රතිඵලයක් ලෙස වසර 30 කට ආසන්න විනාශකාරී ජනවාර්ගික යුද්ධයක් දක්වා මෙම ජාතික ගැටලුව වර්ධනය වූවා පමණක් නොව දෙමළ හා සිංහල සමාජය අතර සැකය, අවිශ්වාසය, තමන්ම නො ඉවසීමේ තත්ත්ව තුළ මෙම ජන කොටස් අතර තිබූ සම්බන්ධතාවයන්හි දූරස්ථභාවය වර්ධනය කළේ ය.

ශ්‍රී ලංකාවේ ජනවාර්ගික අර්බුදයට දිගු ඉතිහාසයක් ඇත. මහාවංසය නම් ඓතිහාසික මූලාශ්‍රය තුළ පවා සිංහල හා ද්‍රවිඩ ජන කොටස් අතර ගැටුම් පැවති ආකාරය මැනවින් විග්‍රහ කරයි.

ඓතිහාසික වශයෙන් සිංහල ද්‍රවිඩ අරගලය ඉස්මතු වන්නේ දුටුගැමුණු සහ එළාර රජවරුන් සමයේ ය. අතීතයේ සිට ම මෙම ගැටුම විවිධ ස්වරූපයෙන් ක්‍රියාත්මක ව ප්‍රබල සමාජ ගැටලුවක් බවට අද වන විට පත් ව ඇත. මෙය සංකීර්ණ සමාජ ගැටලුවක් වන්නට පදනම සැකසුවේ අධිරාජ්‍යවාදීන් ය. 1776 සිට 1815 දක්වා කාලය තුළ ඉංග්‍රීසීන් මහනුවර රාජධානිය සමග කරන ලද සටන්වලදී ලැබූ කටුක අත්දැකීම් මෙන් ම 1818, 1834, 1848 සිංහල දේශප්‍රේමීන් විසින් දියත් කරන ලද නිදහස් සටන් හා අරගලවලදී මුහුණදීමට සිදු වූ සිද්ධීන් නිසා සිංහලයන් පිළිබඳව බ්‍රිතාන්‍යයන් තුළ වූයේ දැඩි වෛරයකි. මෙම සටන්වලින් ලක්ෂ ගණනක් සිංහල ජනතාව මිය ගිය අතර යළිත් ජාතියක් වශයෙන් නැඟී සිටීමට නො හැකි වන ලෙස ජන නායකයන් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් විනාශ කරන ලදී.

සිංහලයන්ට තවදුරටත් සංවිධානය විය නො හැකි වන ලෙස ජාතීන් කළහ. කපටි බුද්ධියෙන් හා ක්‍රමෝපායෙන් යුක්ත දක්ෂ පාලකයන් වූ ඔවුන් හට සිංහලයන්ගේ දුර්වලකම් මෙන් ම ඔවුන්ට පහර ගැසීම සඳහා අවශ්‍ය ක්‍රමෝපායන් මේ රටේ ඉතිහාසය තුළින් ම සොයාගැනීමට එතරම් අපහසු නො වී ය.

එහිදී පළමුව සිංහලයන් උඩරටියන් සහ පහතරටියන් ලෙස බෙද වෙන් කිරීම ය. දෙවනුව රට මැද දකුණු ඉන්දියානුවන් ලක්ෂ ගණනක් පදිංචි කරවී ය. කෙසේ නමුදු ගැටුමට සම්බන්ධ දෙමළ සටන්කාමීන්ගේ වර්ධනය වටහාගත යුත්තේ නිදහස ලද ලාංකීය රාජ්‍යයේ ජාතිවාදී ප්‍රතිපත්තිය නමැති හරපද්ධතිය තුළ ය.

> "1920 ගණන්වලින් අරඹුණු මෙම මතවාදීමය ගැටුම ක්‍රම ක්‍රමයෙන් වර්ධනය විය. 1931 ඩොනමෝර් වාර්තාව මගින්ද මෙම අනතුරු ඇඟවීම සිදු කළේ ය. රාජ්‍ය මන්ත්‍රණ සභාවට ජාතීන් අනුව නියෝජිතයන් පත් කිරීම අනතුරක් බවත්, විවිධ ජන කොටස් අතර මිත්‍රත්වය සහ ඔවුනොවුන් ඉදිරිපිට ඇති පොදු අරමුණු පිළිගැනීමත්, ඇති වන තෙක් පමණක් එය පැවතිය යුතු බවත් ඔවුන්ගේ පිළිගැනීම විය." (දික්වැල්ල, ප්‍රියන්ත සහ හෙට්ටිආරච්චි, 2003, පිටු අංකය 250)

මේ අනුව 1930 ගණන්වලදී ප්‍රබල ලෙස ඇරඹි මෙම මතවාදී ගැටුම ක්‍රමයෙන් වර්ධනය විය.

> "1939 වර්ෂයේදී දෙමළ නායකයන් පාර්ලිමේන්තු සුළු ජාතික නියෝජනය වෙනුවෙන් 50% ක ඉඩ ප්‍රස්තාව ඉල්ලා සිටීම මඟින් ඩොනමෝර් කොමසාරිස්වරුන්ගේ සැකය ප්‍රත්‍යක්ෂ විය. එසේම 1948 දී ඩී. එස්. සේනානායක රජය විසින් ඇරඹි ජනපදකරණ වැඩසටහන, 1948 අංක 18 දරන පුරවැසි ගමනාගමනය පිළිබඳ පනත හා 1949 දී හඳුන්වා දුන් ලංකා පාර්ලිමේන්තු මැතිවරණ (සංශෝධිත) පනත යනාදිය මඟින් තවදුරටත් ශ්‍රී ලංකාවේ වාර්ගික ජන කොටස් අතර හොඳ හිත පලුදු කළේ ය. 1948 දී ෆෙඩරල් ව්‍යවස්ථාවක් තුළ බලය බෙදගැනීමේ අපේක්ෂාව කරා ඔවුන් ගමන් ගත් බව ෆෙඩරල් පක්ෂය පිහිටුවාගැනීම මඟින් පැහැදිලි වේ." (දික්වැල්ල, ප්‍රියන්ත සහ හෙට්ටිආරච්චි, 2003, පිටු අංකය 250)

තවද, 1948 සිට 1970 කාලය තුළ දෙමළ ජනතාව සම්බන්ධයෙන් සිංහල නායකයන්ගේ ක්‍රියාකලාපය එතරම් සතුටුදායක නොවේ.

> "1948 දී ශ්‍රී ලංකාව නිදහස ලබන විට 781,000 ක් ඉන්දියානු ද්‍රවිඩයන් සිටි අතර එය රටේ මුළු ජනගහනයෙන් 51.56% ක්ද විය. පුරවැසි පනත හඳුන්වා දීම මඟින් පුරවැසි බව පරම්පරාවෙන් සහ ලියාපදිංචි වීම වශයෙන් වර්ග කෙරුණි. මෙම පනත (1949) මඟින් වතුකරයේ ජීවත් වූ ද්‍රවිඩ ජනතාවගෙන් බහුතරයකට එනම් 1953 වන විට ජීවත් වූ බහුතරයට 974,098 ප්‍රමාණයකගේ පුරවැසිභාවය අහිමි කරනු ලැබී ය." (දික්වැල්ල, ප්‍රියන්ත සහ හෙට්ටිආරච්චි, 2003, පිටු අංකය 250)

1948 සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්බන්ධයෙන් ද බහුතරයක් ශ්‍රී ලාංකිකයන්ගේ එකඟතාවක් නොතිබුණි. එය බ්‍රිතාන්‍යයේ පිටපතක් ලෙස සැලකී ය. මෙම වකවානුව වන විට සිංහල, දෙමළ භාෂාවන්ට සම තැන දිය යුතු ය යන ඉල්ලීම පැන නැගුණි එහෙත් සිංහල ජනවාර්ගික ජාතිවාදය විසින් සිංහල රාජ්‍ය

ගැටුමේ පූර්ව අවස්ථාවේදී ඔවුන් දෙවන ජාතියක්ය යන අදහස ඇති කළ අතර 1975 වන විට යුදවාදී දෙමළ තරුණයන් සංවිධානගත වීම ඇරඹිණි. රංජිත් දික්වැල්ල, රේණුක ප්‍රියන්ත සහ ශිරාණි හෙට්ටිආරච්චි විසින් රචිත 'ගැටුම් නිරාකරණ න්‍යාය සහ භාවිතය' කෘතියේ සඳහන් කරන පරිදි යාපනයේ නගරාධිපති ඇල්ප්‍රඩ් දෙරේඅප්පා 1975 දී ඝාතනය කළ අතර එය දෙමළ සටන්කාමී තරුණයන්ගේ පළමු දේශපාලන ඝාතනය විය. එසේ ම 1976 දී දෙමළ එක්සත් විමුක්ති පෙරමුණ පිහිටුවාගැනීමත්, 1976 මැයි 14 වන දින සම්මත කළ වඩුක්කෝඩෙයි යෝජනාවන් පිළිබඳ වැඩිදුර විස්තර සඳහන් වෙයි.

1977 මහ මැතිවරණයේදී වෙන ම රාජ්‍යයක් යන මතයේ පිහිටා ආසන 23කට තරග කළ අතර, එයින් ආසන 18 ක් දිනා ගැනීමට සමත් විය. ඒ සමගම ඔවුන් පාර්ලිමේන්තුවේ ප්‍රධාන විපක්ෂය බවට පත් විය. එහෙත් මැතිවරණයෙන් පසුව ඇති වූ ජාතිවාදී කෝලාහලය හේතුවෙන් දෙමළ ජාතිකයන් අනාථභාවයට පත් විය.

> "මැතිවරණයෙන් පසුව ඇති වූ ජාතිවාදී කෝලාහල හේතුවෙන් අනාථභාවයට පත් දෙමළ ජන සංඛ්‍යාව 50,000 ක් පමණ වූ අතර, මරණයට පත් පුද්ගලයන් 131 දෙනෙකු අතරින් 120 ක් දෙමළ ජාතිකයන් විය. එමඟින් වඩාත් ආක්‍රමණශීලී වූයේ දෙමළ සටන්කාමී කණ්ඩායම් ය." (දික්වැල්ල, ප්‍රියන්ත සහ හෙට්ටිආරච්චි, 2003, පිටු අංකය 255)

1981 දිස්ත්‍රික් සංවර්ධන සභා මැතිවරණයේදී අපේක්ෂකයන් ගණනාවක් ඝාතනය කරන ලදී. මෙහිදී රජයේ මිලිටරි හමුදාව ප්‍රතිප්‍රහාර එල්ල කළ අතර දෙමළ සංස්කෘතියේ පමණක් නොව මෙරට ඉතිහාසයේ ඥාන ගබඩාවක් වූ යාපනය පුස්තකාලය විනාශ විය.

> "ගැටුමේ අර්බුද හා ප්‍රතිවිපාක අවස්ථාව 1983 න් පසුව ආරම්භ වේ. 1983 දී දෙමළ සටන්කාමීන් විසින් රජයේ සොල්දදුවන් 13 දෙනෙකු ඝාතනය කිරීමෙන් වූ ප්‍රචණ්ඩ කලකෝලාහල මඟින් ජීවිත 600 ක් පමණ විනාශ විය. 79,000 කට අධික පිරිසක් සරණාගත භාවයට පත් විය.

> මෙම සිදුවීම හේතුවෙන් 1983 න් පසුව දෙමළ සටන්කාමීන් වඩාත් ශක්තිමත් වීම ආරම්භ විය." (දික්වැල්ල, ප්‍රියන්ත සහ හෙට්ටිආරච්චි, 2003, පිටු අංකය 256)

මේ හේතුවෙන් දෙමළ සටන්කාමී කණ්ඩායම් වඩාත් ශක්තිමත් විය.

> "උමා මහේෂ්වරන් විසින් ද්‍රවිඩ ඊලාම් ජනතා විමුක්ති සංවිධානය (ප්ලොට්) සහ වේලුපිල්ලේ ප්‍රභාකරන් විසින් ද්‍රවිඩ ඊලාම් විමුක්ති කොටි සංවිධානය (එල්.ටී.ටී.ඊ) ස්ථාපිත කරන ලදි. ඊට අමතරව ඊලාම් ජනතා විප්ලවීය පෙරමුණ (ඊ.පී.ආර්.එල්.එෆ්), දෙමළ ඊලාම් විමුක්ති සංවිධානය (ටෙලෝ), ඊලාම් විප්ලවීය ශිෂ්‍ය සංගමය (ඊරෝස්) ද අවි ගැටුමේ ප්‍රධාන පාර්ශ්වකරුවෝ බවට පත්වූහ." (දික්වැල්ල, ප්‍රියන්ත සහ හෙට්ටිආරච්චි, 2003, පිටු අංකය 256)

1987 පළාත්සභා ස්ථාපිත කිරීම තුළ බොහෝ කණ්ඩායම් ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලන රාමුවකට අවතීර්ණ වූහ. පසුකාලීනව සන්නද්ධ ව තම අරමුණු වෙනුවෙන් සටන දියත් කළේ එල්. ටී. ටී. ඊ. සංවිධානය යි.

ජනවාර්ගික අර්බුදයට ද හේතු වූ දේශපාලන පසුබිම ඍජු ව ම සලකා බැලුවහොත් 1833, 1910 කෝල්බෲක් සහ මැනිං ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ දමිළයන්ගේ අධිතක්සේරුවට හේතු වුවද එම තත්ත්වය බිඳ වැටෙන්නේ 1931 ඩොනමෝර් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය හඳුන්වාදීමත් සමග යි. සර්වජන ඡන්ද බලය හඳුන්වාදීම, ජාතීන් අතර තමන් අවතක්සේරුවට ලක් කළා යැයි දමිළයෝ කල්පනා කළහ. 1956 දී එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක මහතා ෆෙඩරල් ක්‍රමය යෝජනා කළ ද දමිළයෝ ඒ සම්බන්ධ ව උනන්දු නොවූහ. එසේ ම 1956 දී රාජ්‍ය භාෂාව සිංහල භාෂාව කිරීම, 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් බුද්ධාගමට විශේෂ තැනක් දීම, 1972 දී හා 1978 දී සිදු වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදනයේදී දෙමළ නියෝජිතයන්ගේ සහාය ලබා ගැනීම නොවීම ද, 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අයිතිවාසිකම් වෙනුවෙන් ආරක්ෂාවක් නොමැති වීම ද ඔවුගේ මතභේදයට හේතු විය. ජනවාර්ගික අර්බුදයේ මත ගැටුම සන්නද්ධ අරගලයක් බවට පත් වීමට හේතු වූයේ දේශපාලන තීරණයන් ය. තව ද ඩී.එස්.

සේනානායක මහතා විසින් රජයේ වියදමින් උතුරු- නැගෙනහිර ප්‍රදේශවල ඇති කළ ජනපද ව්‍යාපාරය දමිළයන්ගේ අවිශ්වාසය තහවුරු විය. වර්ෂ 1950 වන විට සිංහලයන් උතුරු ප්‍රදේශයට පැතිර යාම සමග මෙම තත්ත්වය උග්‍ර විය.

> "වර්ෂ 1946 ත්‍රිකුණාමලයේ ජනගහනය එක් ලක්ෂ හැත්තෑපන්දහසක් හා දශම නවයකි. 1971 දී ජනගහනය එක් ලක්ෂ අසූඅටදහසක් සහ දශම හතරකි. 1981 ත්‍රිකුණාමලයේ සිංහල ජනගහනය 33.62% කි. ශ්‍රී ලාංකික දෙමළ 33.78% කි. ඉන්දීය දමිළ 2.46% කි. ජනගහනය මෙසේ වෙනස් වීමට හේතුව ගොවිජනපද පිහිටුවීමේ ප්‍රතිපත්තිය උඩ සිදු වූවා යැයි තීරණය කිරීම අපහසු වේ. අභ්‍යන්තර සංක්‍රමණ සහ වෙනත් හේතු මෙසේ ජනගහනය වෙනස්වීමට හේතු විය." (රත්නායක, 2001, පිටු අංකය 48)

සිංහලයන් ගොවිජනපදවල පදිංචි කරවීම ඔවුන්ගේ ජාතිවාදී හැඟීම් ඉස්මතු කිරීමට සමත් විය. එසේම බ්‍රිතාන්‍යයන්ට එරෙහි ව ස්වදේශිකයන් ගෙන ගිය පුනරුද ව්‍යාපාරය ද මෙරට දමිළයන්ගේ මතභේදයට හේතු විය.ශ්‍රී ලංකාවේ උතුරු-නැගෙනහිර පළාත්වල පවතින ඊළාම් යුද්ධයට හේතු වූ කරුණු පිළිබඳව සොයා බැලීමේදී ඉහත හේතු සාධක ප්‍රධාන ලෙස බලපෑම් ඇති කළේ ය. මෙම ගැටුම මුලදී ආරම්භ වූයේ ජනගහනයෙන් සුළු කොටසක් අතර පමණි. එහෙත් මෙම සුළු ගැටුම පටු දේශපාලන වාසි වෙනුවෙන් ලංකාවේ දේශපාලන ඉතිහාසය තුළ ගත් වැරැදි තීරණ හේතුවෙන් පසුකාලීන ව දමිළයන් තුළ වෙන ම රාජ්‍යයක් යන සංකල්පය ඉස්මතු කරමින් එය අරමුණු කොටගෙන සන්නද්ධ ගැටුමක් ලෙස ඉස්මතු විය. ඉන් ඇති වුණු සමාජ, ආර්ථික බිඳ වැටීම ශ්‍රී ලංකාවේ සංවර්ධනයේ වර්ධනය සීමා කළේ ය.

## ජනවාර්ගික අර්බුදය විසඳීමට ගත් ක්‍රියා මාර්ග සහ එහි සාර්ථක අසාර්ථක බව

වාර්ගික විවිධත්වය තුළ ජාතික ඒකාග්‍රතාවත්, භෞමික අඛණ්ඩතාවත් ඇති කිරීම සඳහා අතීතයේ පටන් ම නොයෙකුත් උත්සාහ ගෙන ඇත. ඒ සඳහා එදා මෙදා තුර ගත් විසඳුම් හා එම විසඳුම් සාර්ථක කරගැනීමට ගත් උත්සාහයේදී එල්ල වූ විරෝධතා

ද, එහි සාර්ථක අසාර්ථක බව ද මෙමගින් සාකච්ඡා කිරීමට උත්සාහ ගනියි.

යටත් විජිතවාදී දේශපාලන ප්‍රතිපත්ති හේතුවෙන් අනාගතයේදී මෙරට ජනවාර්ගික අර්බුදයක් ඇති වන බවත් ඒ සඳහා ෆෙඩරල් ආණ්ඩුක්‍රමයක් අවශ්‍ය බවත් 1926 දී එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක මහතා ප්‍රකාශ කළේය. එම ප්‍රකාශය 1926 ජූලි 17 'සිලෝන් මෝනිං ලීඩර්' පුවත්පතේ පළ කොට තිබිණි. ශ්‍රී ලංකාව තුළ ඒ වන විට ඇති වී තිබුණු උඩරට, පහතරට බෙදීම නිසා සිදු වන දුෂ්කරතා මගහැරවීමට උඩරට නායකවරු ස්වයං පාලන කොටස් තුනකට දිවයින බෙදීමට යෝජනා කළහ. එනම් ද්‍රවිඩයන් බහුල ව ජීවත් වන උතුරු සහ නැගෙනහිර පළාත්, දකුණ හා බස්නාහිර පළාත් යනුවෙනි. මේ ක්‍රමය අනුව මේ ජන කොටස් තුනට ම ස්වයං පාලනය සහිත ආණ්ඩුවක් ලැබෙනු ඇතැයි යන්න ඔවුන්ගේ විශ්වාසය විය. නමුත් 1931 දී සර්වජන ඡන්ද බලය පිරිනැමීමට දෙමළ නායකයන් විරුද්ධ විය.

> "1931 සර්වජන ඡන්ද බලය මෙරටට පිරිනැමීමට දමිළ නායකයන් විරුද්ධ විය. 1936 වන විට සර්වජන ඡන්ද බලය තුළ නියෝජනය පුළුල් වීමත්, ඒ නිසා වතුකරයේ පාලනයක් ගොඩනැගීමත් ඩී. එස්. සේනානායක මහතා විසින් සර්ව සිංහල අමාත්‍ය මණ්ඩලයක් නිර්මාණය කර ගැනීමත් නිසා දමිළ නායකයෝ නැවතත් සිය විරෝධය පළ කළහ." (හේමන්ත, 2006, පිටු අංකය 26)

1944 දී ලංකා ජාතික සංගමය මගින් ජාතීන් අතර සහජීවනය ඇති කිරීමේ අරමුණින් යෝජනා මාලාවක් ඉදිරිපත් කරන ලදී. 1947 මහ මැතිවරණයේ ප්‍රතිඵල වාමාංශික නැඹුරුවකින් යුක්ත විය. ඒ හේතුවෙන් වාමාංශිකයන් එකතු වී රජයක් පිහිටුවීමට සාකච්ඡා පැවැත්වීය. එහෙත් එය අසාර්ථක වූ අතර එම අවස්ථාවෙන් ප්‍රයෝජන ගත ඩී. එස්. සේනානායක මහතා පුරවැසි පනත හරහා වතුකරයේ දෙමළ ජනතාවගේ ඡන්ද අයිතිය තහවුරු කරන ලදී. මේ අවස්ථාවේදී සුන්දරලිංගම් මහතා ආණ්ඩුවෙන් ඉවත් වී විරෝධය පෑ අතර ඒ පිළිබඳව නුවන් හේමන්ත විසින් රචිත 'ශ්‍රී ලංකාවේ ජනවාර්ගික අර්බුදය සම්බන්ධ එකගතා හා විරෝධතා' යන කෘතියේ සඳහන් වේ. එහිදී ජී. ජී. පොන්නම්බලම් මහතා එම

පුරප්පාඩුව සඳහා පත් කෙරිණි. 1956 බණ්ඩාරනායක මහතා සංඝ, වෙද, ගොවි, කම්කරු පංච මහා බලවේග එක් කොට ආණ්ඩුවක් පිහිටුවීය.

> "පංචමහා බලවේගයන්ගෙන් පන්නරය ලද බණ්ඩාරනායක මහතා 1956 විශිෂ්ට ජයග්‍රහණයක් අත්කර ගෙන ආණ්ඩුවක් පිහිටුවීය. ආණ්ඩුවක් පිහිටුවීමට පටන් ගත් අවස්ථාවේ පටන් සිංහලකම අගය කළ මෙතුමා ආණ්ඩුව පිහිටුවීමත් සමග සිංහල රාජ්‍ය භාෂාව බවට පත් කළේ ය. මේ නිසා වාර්ගික විරෝධතා ප්‍රබල ලෙස මතුවන්නට වූයෙන් 1957 ජුලි 26 වන දින බණ්ඩාරනායක - චෙල්වනායගම් ගිවිසුම අත්සන් කෙරිණි." (හේමන්ත, 2006, පිටු අංකය 34)

අවස්ථාවාදී දේශපාලනය හේතුවෙන් එම ගිවිසුම අසාර්ථක විය. 1959 දී බණ්ඩාරනායක මහතා ඝාතනය කිරීමෙන් පසු නිදහස් පක්ෂයට නායකත්වය දීමට සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය ඉදිරිපත් විය. සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය සිරිමා - ශාස්ත්‍රී ගිවිසුම 1964 දී අත්සන් කළ අතර එහි පැවති අක්‍රමිකතා හා සිදුවූ අසාධාරණකම් හේතුවෙන් ද්‍රවිඩ ජනතාවගේ විරෝධතා ඒ සඳහා දිගින් දිගටම එල්ල විය.

1956 බණ්ඩාරනායක - චෙලවනායගම් ගිවිසුමට විරෝධය පෑ ඩඩ්ලි සේනානායක සහ එක්සත් ජාතික පක්ෂය 1965 ආණ්ඩු බලය ලබා ගැනීමෙන් පසු එම ආණ්ඩුවේ හවුල්කාරී ෆෙඩරල් පක්ෂය සමග ගිවිසුමකට එළඹිණි. එහි යෝජනා වූයේ,

1. උතුරු - නැගෙනහිර පළාත්වල පරිපාලන සහ වාර්තා කරන භාෂාව ලෙස දෙමළ භාෂාව යොදගනු සඳහා දෙමළ භාෂා විශේෂ ප්‍රතිපාදන පනත යටතේ ඉක්මනින් පියවර ගනු ලැබේ.

2. උතුරු - නැගෙනහිර පළාත්වල නෛතික කටයුතු දෙමළ භාෂාවෙන් සිදු කිරීම සහ වාර්තා කිරීම සඳහා භාෂා ප්‍රතිපාදන සලසනු වස් අධිකරණ පනත සංශෝධනය කිරීම ස්වකීය පක්ෂයේ ප්‍රතිපත්තිය බව ද සේනානායක මහතා සඳහන් කළේ ය.

3. නායකයන් දෙදෙනා අතර එකඟත්වයට පැමිණෙන විෂයයන් පිළිබඳ බලතල සහිත දිස්ත්‍රික්ක සභා ලංකාවේ පිහිටුවීමට පියවර ගනු ලැබේ.

4. ඉඩම් සංවර්ධනය රෙගුලාසි යටතේ ලංකාවේ පුරවැසියන්ට ඉඩමක් ලැබීමේ හිමිකම ලැබෙන අයුරින් එකී රෙගුලාසිය සංශෝධනය කරනු ලැබේ. " (හේමන්ත, 2006, පිටු අංක 48-49)

නිදහස් පක්ෂය මඟින් එම ගිවිසුමට විරෝධය එල්ල කරන ලදී. මෙම විරෝධතා මතු වීම සිදු වන්නේ 1966 ජනවාරි 08 වන දින දෙමළ භාෂා විශේෂ විධිවිධාන පනත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමත් සමග ය. මෙම විරෝධතා හේතුවෙන් චෙල්වනායගම් මහතාගෙන් නො විමසා ගිවිසුම ඉවත දැමීම නිසා 1968 ෆෙඩරල් පක්ෂය ඩඩ්ලිගේ ආණ්ඩුවෙන් ඉවත් විය.

1970 දී ප්‍රථම ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කෙටුම්පත පිළියෙල කරන අවස්ථාවේදී ෆෙඩරල් පක්ෂය ගෙනා යෝජනා නොපිළිගැනීම හේතුවෙන් තම බලය පෙන්වීමට 1972 දී ෆෙඩරල් පක්ෂය තවත් ද්‍රවිඩ පක්ෂ 4ක් සමග එක් ව ද්‍රවිඩ එක්සත් විමුක්ති පෙරමුණ පිහිටුවී ය.

1977 මැතිවරණයේදී ද්‍රවිඩ එක්සත් විමුක්ති පෙරමුණ ද්‍රවිඩ ජනතාවගෙන් වරමක් ඉල්ලී ය. ඔවුන්ගේ අරමුණ වූයේ දෙමළ ඊලාම් රාජ්‍යයක් පිහිටුවාගැනීම හෙවත් වෙන ම රාජ්‍යයක් ලබාගැනීම යි.

"ජනවාර්ගික ගැටුමට දේශපාලන විසඳුමක් ලබාදීම සඳහා ගනු ලැබූ මීළඟ උත්සහය ලෙස 1980 අංක 35 දරන සංවර්ධන සභා පනත සඳහන් කළ හැකි ය. 1950 දශකය අගභාගයේ සිට විටින් විට බලතල විමධ්‍යගතකරණය කිරීමට උත්සාහ දරන ලද මුත්, ප්‍රථම වතාවට පනතක් යටතේ බලතල විමධ්‍යගත කිරීම මෙමඟින් සිදු විය. 1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ රාජ්‍ය ප්‍රතිපත්ති මෙහෙයවීමේ මූලධර්ම සහ මූලික යුතුකම් පිළිබඳ සඳහන් හය වන පරිච්ඡේදයේ 27(4) වන වගන්තිය මගින් මීට අදාළ මූලික විධිවිධාන දක්වා තිබේ. ඒ අනුව දිස්ත්‍රික් සංවර්ධන

සහා ස්ථාපිත කිරීම මගින් මෙරට සංවර්ධන කටයුතුවලට සමාන්තරව ජනවාර්ගික ගැටලුවට විසඳුම් ලබාදීම අරමුණු කරගනු ලැබී ය. එහෙත් මෙය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක් මඟින් නො කළ හෙයින් සහ තවත් දුර්වලතා රාශියක් හේතු කොටගෙන දිස්ත්‍රික් සංවර්ධන සභා ක්‍රමය අසාර්ථක එකක් විය." (දික්වැල්ල, ප්‍රියන්ත සහ හෙට්ටිආරච්චි, 2003, පිටු අංකය 267)

ඇතිවූ මතභේදාත්මක පරිසරය සන්නද්ධ අරගලයක් වන්නේ 1983 කළු ජූලියෙන් පසුව ය.

"1983 ජූලි 23 වන දින යාපනයේ හමුදා සෙබළුන් 13 දෙනකු ඝාතනය කිරීම තුළ දකුණේ මතු වූ දමිළ විරෝධය මුළු රට ම ප්‍රචණ්ඩකාරී බිහිසුණු තත්ත්වයකට පත් කළේ ය.

| | |
|---|---|
| මරණයට පත් සංඛ්‍යාව | 471 |
| දේපළ ගිනි තැබීම් | 8077 |
| මංකොල්ලකෑම් | 3833" |

(හේමන්ත, 2006, පිටු අංකය 59)

මේ හේතුවෙන් ජාත්‍යන්තරයේ අනුකම්පාව ද්‍රවිඩයන්ට හිමි විය. මෙම සමස්ත සිදුවීම ජාතික ගැටලුව වෙනස් මඟකට යොමු කිරීමට සමත් විය. 1985 තිම්පු නුවරදී උතුරු - නැගෙනහිර ගැටලුව විසඳීම සම්බන්ධයෙන් බහු පාක්ෂික සාකච්ඡාවන් පැවැත්වී ය.

"1985 ජූලි මාසයේ 10 වන දින භූටානයේ (භූතානයේ) අගනුවර වන තිම්පුහිදී ලංකාණ්ඩුවේ නියෝජිතයන් හා දෙමළ එක්සත් විමුක්ති පෙරමුණේද, අනෙකුත් කණ්ඩායම්වල නියෝජිතයන් අතර දෙමළ ජාතික ප්‍රශ්නයට විසඳුම් සෙවීමේ සාකච්ඡා වටයක් ආරම්භ විය." (ඩයස්, 2000, පිටු අංකය 48)

මෙම සාකච්ඡාවලට දමිළ නායකයන් එකහෙළා විරුද්ධ වූහ. තිම්පු සාකච්ඡා අසාර්ථක වුව ද 1987 ජූලි මස ශ්‍රී ලංකාවේ ජනාධිපති ජේ. ආර්. ජයවර්ධන මහතා සහ ඉන්දීය අගමැති රජීව් ගාන්ධි මහතා අතර ලංකාවේ සාමය හා සමානාත්මතාවය ආරක්ෂා කිරීමේ අරමුණින් ඉන්දු - ලංකා ගිවිසුමට අත්සන් තබන ලදී. 1987

දරන පළාත් සභා පනත සම්මත කර මධ්‍යම රජයේ බලය බෙදා හැරි නමුත් ද්‍රවිඩ ජනතාව බහුතරය වෙසෙන උතුරු - නැගෙනහිර එක් පළාතක් කිරීමත්, පසුකාලීනව එම පළාත තුළ පළාත් සභා ක්‍රමය ක්‍රියාත්මක නොවීමත් ඉන්දු ලංකා සාම ගිවිසුම අසාර්ථක වන්නට හේතුවක් විය.

> "ගැටුම විසඳීම සඳහා ගනු ලැබූ මීළඟ සාකච්ඡා වාරය 1989 ජනාධිපතිවරණයෙන් ජයගත් ආර්. ප්‍රේමදාස ජනාධිපතිවරයාගේ පාලන කාලය තුළ සිදු විය. ජනවාර්ගික ගැටුම නිරාකරණය සම්බන්ධයෙන් ප්‍රේමදාස ජනාධිපතිවරයාගේ ස්ථාවරය වූයේ ඉන්දීය සාමසාධක හමුදාව රටින් නික්ම යා යුතු බව යි." (දික්වැල්ල, ප්‍රියන්ත සහ හෙට්ටිආරච්චි, 2003, පිටු අංකය 269)

මෙම සාකච්ඡා දින 14 කින් බිඳ වැටුණි. ගැටුම විසඳීමේ අරමුණින් 1994 දී බලයට පත් පොදුජන එක්සත් පෙරමුණු රජය මගින් සාකච්ඡා පැවැත්වී ය.

1994 දී ජනාධිපති ලේකම් බාලපටබැඳිගේ ප්‍රධානත්වයෙන් සමන්විත නියෝජිත පිරිස එල්. ටී. ටී. ඊ න්‍යායාචාර්ය ඇන්ටන් බාලසිංහම් ඇතුළු පිරිස සමග සාකච්ඡා පැවැත්වී ය. මෙම සාකච්ඡා සඳහා තෙවන වටයේදී සටන් විරාමයක් ඇති කරගැනීමට උත්සාහ කළ අතර 1995 අප්‍රේල් 19 වන දින එල්. ටී. ටී. ඊ සංවිධානය විසින් ත්‍රිකුණාමල වරායට පහර දීමත් සමග 'වීරයා ' සහ 'රණසුරු' යන නාවික යාත්‍රා දෙක ඇතුළු නාවික සෙබළුන් 11 දෙනෙක් ඝාතනය කිරීමත් සමගින් මෙම සාම ක්‍රියාදාමය ව්‍යර්ථ විය.

2001 මහ මැතිවරණයේදී තමන් බලයට පත් වුවහොත් දේශපාලන විසඳුමක් ලබාදීමට කටයුතු කරන බව එක්සත් ජාතික පක්ෂ නායක රනිල් වික්‍රමසිංහ ප්‍රකාශ කළේ ය. ඒ අනුව එක්සත් ජාතික පක්ෂය 2001 දී සන්ධානගත ආණ්ඩුවක් ඇති කරගනිමින් එක්සත් ජාතික පෙරමුණ පිහිටුවාගත් අතර එල්. ටී. ටී. ඊ සංවිධානය නෝර්වේහි ඔස්ලෝ නුවර පැවති ආධාර සමුළුවට සහභාගි කර නොගැනීම හේතුවෙන් ඔවුන් සහභාගි වීමෙන් වැළකෙන බවට ප්‍රකාශ කරමින් සාම සාකච්ඡාවලින් ඉවත් විය. 2001 අවබෝධතා ගිවිසුම අත්සන් කළ ද එහි පැවති දුර්වලතා නිසා එය අසාර්ථක විය.

2004 දී චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය ප්‍රමුඛ රජය විසින් යළිත් එල්.ටී.ටී.ඊ ය සමග සාකච්ඡා කළද එයද අසාර්ථක විය. යුද්ධයට යුද්ධය විනා වෙනත් විසඳුමක් නැති බව ප්‍රත්‍යක්ෂ කරගත් 2006 දී බලයට පත් ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා විසින් එල්. ටී. ටී. ඊ සාමාජිකයන් විසින් වසා දමන ලද මාවිල් ආරු සොරොව්ව විවෘත කරමින් යුද්ධය ප්‍රතිවාදීන්ට එරෙහිව අරඹන ලදී.

2006 දී යුද්ධය ආරම්භ වන විට රජයේ හමුදාව ක්‍රියාකාරිත්වයෙන් හා වෙඩි බලයෙන් ප්‍රබල වූ අතර 2008 දී හමුදා සෙබළුන් 40,000 ක් බඳවා ගැනීමත්, ගොඩබිම්, ගුවන් හා නාවික බළකායන්ගේ ශක්තිමත් භාවයත්, ජාත්‍යන්තර බලපෑම්වලට හසු නොවීමත් හේතුවෙන් 2009 මැයි 18 වන දින එල්. ටී. ටී. ඊ නායක වේලුපිල්ලේ ප්‍රභාකරන් ඝාතනය කිරීමත් සමග යුද්ධය නිල වශයෙන් නිමා විය.

## යුද්ධයේ සාමාජ්ය බලපෑම

යුද්ධයේ මතවාදීමය අරගලය බ්‍රිතාන්‍යය යටත් විජිත සමයටත් එහා ඉතිහාසයකට උරුමකම් කියයි. එහෙත් එය සන්නද්ධ අරගලයක් ලෙස වර්ධනය වන්නේ 1983 කළු ජුලියෙන් ප්‍රතිඵලයක් වශයෙනි. මානව සමාජය විකාශනය වීම සමග යුද තාක්ෂණය හා යුද ශිල්ප ක්‍රම හා තම ශක්තිය අනෙකා ඉදිරියේ පෙන්වීම සඳහා ඉතිහාසය පුරාම මෙම මිහිතලය මත යුදමය තත්ත්වයක් පැවති මොහොතක් හෝ ස්ථානයක් සොයාගැනීම එතරම් අපහසු නො වී ය. යුද්ධයේ යහපත් අයහපත් ප්‍රතිඵල පිළිබඳව අතීතයේ සිටම විවිධ දර්ශනිකයන්, සමාජ විද්‍යාඥයන්, මානව විද්‍යාඥයන් විසින් අදහස් පළ කරන ලදී.

> "කොන්ෆියුසියස් මෙන් ම ටිෂු පෑන්, හුන් ට්සු, මෙන්සයස් වැනි චීන චින්තකයෝ යුද්ධයේ අවශ්‍යතාව ගැන මෙන්ම එහි අත්‍යවශ්‍යතාව ගැන ද අදහස් දක්වා ඇත. චීනය යනු පුරාණ යුගයේ සිට ම බිහිසුණු යුද්ධයන්ටම කේන්ද්‍ර වූ දේශයකි. මෙම හේතු නිසාම බොහෝ චින්තකයන් මෙම විශේෂ විෂය ගැන අදහස් දක්වන්නට පෙලඹී ඇති බව පෙනී යයි. ලාඕට්සු (LAO-

TZU) නම් මුනිවරයාගේ යැයි සැලකෙන 'ටාඕ ටේ චින්ග්' (TAO THE CHING) යන කෘතියෙහි යුද්ධය පිළිබඳව අදහස් දැකිය හැකි ය. 'සියලුම උපකරණයන්ගෙන් අවි ආයුද කොපමණ සාර්ථක වුවද ඒවා සාපරාධීය' හැම මිනිසුන් ම ඒවා පිළිකුලට බඳුන් කරයි. බුද්ධිමතෙකුට ම අදළ දෑ නොවේ. අවසාන ප්‍රයත්නයේදී පමණක් ඔහු ඒවා යොද ගනියි' යනුවෙන් ලාඕට්සසු මුනිවරයා සඳහන් කරයි." (වීරසූරිය, 1996, පිටු අංකය 101)

යුද්ධයේ යහපත් අයහපත් ප්‍රතිඵල මොනවා ද යන්න කෘත්‍යාත්මක ක්‍රමය ඔස්සේ කරුණු ගවේෂණය කළ හැකි ය.

"කෘත්‍යාත්මක ක්‍රමවේදය හෝ එවැනි විශ්ලේෂණයක් ඔස්සේ දශක දෙකක් පුරා දිව ගිය ශ්‍රී ලංකාවේ සුළු ජාතික අර්බුදය පදනම් කරගත් යුද්ධය හා සම්බන්ධ යහපත් මෙන් ම අයහපත් ප්‍රතිඵල මොනා ද යන්න විමසා බැලිය යුතු ය." (කරුණාතිලක, 2007, පිටු අංකය 28)

යුද්ධය තුළ ඍජු ව දක්නට ලැබෙන්නේ අයහපත් බලපෑම්ය. එහෙත් සමහර අවස්ථාවල යුද්ධය සමාජ සංස්ථාව පවත්වාගෙන යාමට අවශ්‍ය පදනම සකස් කරයි.

"කෙසේ වෙතත් යුද්ධය යන්න විනාශකාරී දෙයකි. එබැවින් යුද්ධයකදී පළමුව නැසී යන්නේ සත්‍යය යි යනුවෙන් ඩෙනිසහිල් නමැත්තා ප්‍රකාශ කරයි. යුද්ධය පිළිබඳ අදහස් දක්වන මහ සෙනෙවි වේවැල් මෙසේ ප්‍රකාශ කරයි. යුද්ධය වනාහි මහා ඉගෙනුම්කරුවෙකි. යුද්ධයක් ඇති වූ විට දිනීමට වුවමනා මුදල් අඩු නැති ව හැම පැත්තෙන්ම ලැබෙයි. එහෙත් ලෝක සාමය රැකීමට බාධා වන දිළිඳුකම, නූගත් බව, රෝගී බව, විරැකියාව දුරු කිරීමට එසේ මුදල් වැය කරන ජාතියක් ලොව නැත. යුද්ධය යන සංකල්පය පිළිබඳව බිවර්ජ්ගේ අදහස වන්නේ මිනිසා විසින් යුද්ධය නිපදවා ඇති බැවින් මිනිසුන්ට ම එය නැති කළ හැකි ද වේ යන්නයි." (ගුණරත්න, 2005, පිටු අංකය 274)

ශ්‍රී ලංකාවේ යුද්ධයේ පාර්ශ්වකරුවන් ශ්‍රී ලංකා රජය සහ ද්‍රවිඩ විමුක්ති කොටි සංවිධානය යි. ලංකාව තුළ පැවති දිගුකාලීන යුද්ධය හේතු කොටගෙන සිවිල් ජන සමාජයේ යහපත් සම්බන්ධතාවන් පලුදු විය. සමාජයේ අපරාධ සහ අපචාරයන් මෙන්ම සිවිල් සමාජයේ හැසිරීම් රටාව ව්‍යාකූල වීම දැකගත හැකි ය. යුද්ධයේ අයහපත් බලපෑම පිළිබඳව සාකච්ඡා කිරීමේදී මියයාම, අංගවිකල වීම, අවතැන් වීම තුළ සමාජ සංස්ථාවන්ගේ විකෘති වීම දැකගත හැකි ය.

> "සුළු ජාතීන්ගේ අර්බුදය හේතු කොටගෙන යුද්ධයෙන් පුද්ගලයන් 65,000 ක් පමණ මිය ගොස් තිබේ. එසේම රජයේ හමුදා සෙබළුන් 15,000 ක් පමණ අංගවිකල වී තිබේ. මීට අමතරව උතුරු ප්‍රදේශයේ පුද්ගලයන් 20,000 කට අධික සංඛ්‍යාවක් අංගවිකල වී තිබේ." (කරුණාතිලක, 2007, පිටු අංකය 131)

යුද්ධයෙන් ලක්ෂ ගණනක් අවතැන් විය. ඉන් වඩා පීඩාවට පත්වන්නේ කාන්තාවන්, ළමයින් සහ වයස්ගත පුද්ගලයන් ය. ජනතාවට නිසි කායික පෝෂණයක් නොමැති වීම, පුද්ගලයන් රෝගී වීම, බෝවන රෝග පැතිර යාම, සනීපාරක්ෂක කටයුතු නිසි පරිදි ඉටු නො වීම ආදි සමාජ අපේක්ෂාවන් අහිමි වීම තුළ සිදු වන්නේ තව දුරටත් ඉච්ඡාභංගත්වයට පත් වීම යි. එසේ ම රට තුළ ආයුද සංසරණය වැඩි වීම, පුද්ගලයන් මිය යාම, අනාරක්ෂිත බව, පාතාල කණ්ඩායම් ඇති වීම යුද්ධයේ අයහපත් ප්‍රතිඵලයන් ය.

උතුරු - නැගෙනහිර මෙන් ම රටේ සෙසු ප්‍රදේශවල ද භෞතික සම්පත් විනාශ වී ඇත. යාපනයේ පුස්තකාලය, මහ බැංකුව, දළදා මාළිගය මෙන් ම ස්වභාවික වනාන්තර, වනසතුන් විනාශ වී ඇත. එසේ ම ජනවාර්ගික ඒකාබද්ධතාව බිඳ වැටීම තුළ සිංහල, ද්‍රවිඩ, මුස්ලිම් ජනවර්ග එකිනෙකට නො සලකා හැරීම සහ අන්‍යෝන්‍ය සුහදතාව නොමැති වීම තුළ එකිනෙකාට විරුද්ධ මතවාදයන් ගොඩනැඟීම සිදු වේ. එසේ ම යුද්ධය යනු සදාචාරයට පටහැණි ක්‍රියාවකි. සෑම මිනිසෙකුට ම සමාජය තුළ ජීවත් වීමේ අයිතිය ඇත. යුද්ධය හේතුවෙන් එම අයිතිය නැති වී ඇත. එසේම සමාජ ධර්මතා හා ඇගයුම් බිඳවැටීම හා වෙනස් වීම සිදු වේ. මිනිසාගේ පැවැත්මට හේතු වන සමාජ ධර්මතා බිඳවැටීම

සමාජ සංවිධානය විසංවිධානකාරී වීමට හේතු වේ. වර්තමානයේ එකිනෙකා අතර ඇති වන අමනාපකම් හෝ මතභේදවලට වඩා තවකෙකු ඝාතනය කිරීමට මිනිසුන් පෙලඹෙන්නේ මෙම සදාචාරාත්මක පර්යායේ සිදු ව ඇති බිඳ වැටීම් නිසා ය.

යුද්ධය හේතු කොටගෙන දුෂ්සමායෝජනයක් ඇති වීම හා මානසික ආතතීන්වලින් පිරුණු ජනතාවක් ඇති වීම ප්‍රචණ්ඩකාරී පුද්ගල චරිත බිහි වීමට හේතුවකි. යුද්ධය හේතු කොටගෙන ජනතාවගේ සිවිල්, ආර්ථික, දේශපාලනික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇත. උතුරු - නැගෙනහිර ඡන්ද අයිතිය වසර ගණනාවක් අහිමි වී තිබීමෙන් ඒ බව ප්‍රත්‍යක්ෂ වේ.

යුද්ධය හේතුවෙන් සමාජ ප්‍රශ්න රාශියක් උද්ගත ව ඇත. ප්‍රබල ම සමාජ ප්‍රශ්නය වන්නේ අපරාධවල ව්‍යාප්තියයි. ආයුද සංසරණය වැඩි වීම, සදාචාරාත්මක පරිහානිය, හමුද සෙබළුන් සේවා කාලය අවසන් වීමට පෙර රහසිගත ව සේවය අත්හැර දැමීම, මංකොල්ලකෑම්, මිනීමැරුම්, ස්ත්‍රී දූෂණ, පැහැර ගැනීම්, සොරකම්, අවි ජාවාරම්, පාතාල කණ්ඩායම් බිහි වීම යනාදි ගැටලු රැසකට මුහුණ පෑමට සිදු ව ඇත.

> "විසි වසරක යුද්ධය වෙනුවෙන් අවංක ව සේවය කොට ජීවිත පූජා කළ යුද නායකයන් සහ සොල්දාදුවන් බොහෝ ය. යුද්ධය ජීවිකාව කරගත් යුද නායකයන් ද බොහෝ ය. ලොව ප්‍රධානතම කොමිස් ජාවාරම ඇත්තේ යුද්ධායුද වෙළෙඳාමෙහි ය." (ඔබේසේකර, 5 වෙනි කලාපය, 2002, සාම විමර්ශී, පිටු අංකය 18)

මීට අමතරව දුගී භාවය හේතුවෙන් ගණිකා වෘත්තිය, සියදිවි නසා ගැනීම, දූප්පත්කම ආදී සමාජ ප්‍රශ්න ඇති විය. එසේම යුද වියදම් පියවීමට ත්‍රස්තවාදීන් රහසිගත ව සිදු කරනු ලබන මත්පැන් හා මත්ද්‍රව්‍ය අලෙවිය සමාජය තුළ තවත් අතුරු ප්‍රශ්න රැසක් ඇති කර ඇත. එනම් ළමා අපයෝජනය, මානසික ආබාධ වැනි සමාජ ප්‍රශ්න ඇති වේ.

යුදමය වාතාවරණය තුළ පවුල් සබඳතා බිඳවැටීම දක්නට ඇත. යුද්ධය හේතු කොටගෙන මියයන පුරුෂයන් නිසා වැන්දඹුවන් වන කාන්තාව හා තනි වන දරුවන්ට සමාජ ආරක්ෂාවක් නොමැති

වීම හා ආර්ථික ගැටලුවලට මුහුණපෑමට සිදු වීම දක්නට ඇත. මීට අමතරව ආර්ථික පරිහානිය තුළ රටේ සංවර්ධනය ඇනහිටීම දක්නට ඇත. එසේ ම යුද්ධයක් පවත්වාගෙන යන්නේ රටේ ජනතාවගේ බදු බර මත යි. ඒ අනුව බදු පනවන්නේ භාණ්ඩ මත යි. සෑම පුද්ගලයකුම යුද්ධය පවත්වාගෙන යාම සඳහා දයක වන්නේ රජයට බදු ගෙවීමෙන් ය. මේ අනුව අප මුහුණදෙන අධික ජීවන බර යුද්ධයේ අනිසි ප්‍රතිඵලයකි.

යුද්ධය සියලු ම අංශවල නිෂ්පාදන සහ ආර්ථික ක්‍රියාකාරිත්වය කෙරෙහි අයහපත් බලපෑමක් ඇති කරයි. ඉන් එක් දෙයක් නම් කෘෂි නිෂ්පාදනයේත්, පශු නිෂ්පාදනයේත්, සංචාරක කර්මාන්තයේත් පහත වැටීමත්, දුම්රිය සේවයේ, පණිවිඩ හුවමාරු සේවය සහ විදුලිබල සැපයුම් යන සේවාවන්වල බිඳ වැටීමත් ය. මේවා අතීත තත්ත්වය සමග සංසන්දනය කර ඇස්තමේන්තු කළ හැකි ය. අනෙකුත් හානි පාඩු ඇති කළ එනම් වෙළෙඳාම සහ ආයෝජනය බිඳ වැටීම පිළිබඳව පැහැදිලි ඇස්තමේන්තුවක් කළ නොහැකි තත්ත්වයක් මතු ව ඇත. අනෙකුත් හානි පාඩු ඇති කළ වෙළෙඳාම සහ ආයෝජනය සහ බිඳ වැටීම පිළිබඳව පැහැදිලි ඇස්තමේන්තුවක් කළ නො හැකි තත්ත්වයක් මතු ව ඇත.

> "යුද්ධය හේතු කොටගෙන ඇති වූ අතිරේක වියදම් රුපියල් බිලියන 53 ක් ලෙස දක්විය හැකි අතර වාර්ෂික පිරිවැය රුපියල් බිලියන 1.5 ක් වේ. සරණාගත වූවන් සඳහා යන වියදම්වලට කඳවුරු මෙන් ම සුභසාධන මධ්‍යස්ථාන ඉදි කිරීම ද ඇතුළත් ය. රජය මියගිය අයට වන්දි ගෙවීමටද, තුවාල වූවන්ට වන්දි ගෙවීම ද සිදු කර ඇති අතර මෙම ප්‍රමාණය රුපියල් මිලියන 378 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත." (සාම විමර්ශී 5 වෙනි කලාපය, 2002 නොවැම්බර් පිටු අංකය 15)

මේ අනුව යුද්ධය සඳහා අධික පිරිවැයක් දැරීමට සිදු ව ඇත. එපමණක් නොව මේ හේතු කොටගෙන ජාතික ආදයම පහළ වැටී ඇති අතර මෙරට ආයෝජනය සඳහා ඇති ඉඩ ප්‍රස්තාවන් ද අහිමි කර ගෙන ඇත. යුද්ධය හේතු කොටගෙන දේපළ හානි සිදු වෙනවා මෙන්ම රටේ සංවර්ධනයට අවශ්‍යය ශ්‍රම සම්පත හිඟවීම ද දැකිය හැකි ය. නූතන ලෝක රටාව අනුව විශේෂයෙන්

තුන්වන ලෝකයේ රටවල් සංවර්ධිත රටවල් මත යැපෙන අතර යුද්ධය විදේශ ආයෝජන අඩු වීම දැකිය හැකි ය. එසේ ම රාජ්‍ය හා පෞද්ගලික ආයතන දේශපාලනීකරණය වීම හා අල්ලස්, දූෂණ කොමිස් ගැසීම් වර්ධනය යුද්ධයේ තවත් දූෂිත පැතිකඩකි.

> "මෑත කාලයේ සිදු වූ යුද ජාවාරම් දෙස බලන විට ඒවා පිටුපස දේශපාලනඥයන් සිටින බව පැහැදිලි ව අනාවරණය වී තිබේ. සාමය සඳහා උත්සාහ කළ සෑම අවස්ථාවක ම සෙසු දේශපාලන පක්ෂවලින් එයට අකුල් හෙළීම සහ සහයෝගය නොදීමෙන් සාමය ළඟා කරගත නො හැකි ය." (කරුණාතිලක,2007, පිටු අංකය 136)

මේ අනුව පැහැදිලි වන්නේ අල්ලස්, දූෂණ හා විවිධ රහසිගත ජාවාරම් මෙන් ම රාජ්‍යය හා පෞද්ගලික ආයතන දේශපාලනීකරණය වී ඇති බව යි. ත්‍රස්තවාදී ක්‍රියාදාමය තුළ අවතැන් වූ ජනතාව පිළිබඳව සාකච්ඡා කරන විට එමඟින් ඇති කරනු ලබන සමාජ, ආර්ථික, දේශපාලනික ගැටලුකාරී ස්වභාවය අමතක කළ නො හැකි ය. තමා ජීවත් වූ ස්ථිර වාසස්ථාන, රැකීරක්ෂා, නිශ්චල චංචල දේපළ යනාදී සියල්ල අතහැර දමා සිය පණ රැකගැනීමේ අරමුණින් රජයේ පිළිසරණ පතා අනාථ කඳවුරුවලට පැමිණියේ ලක්ෂ සංඛ්‍යාත ජනකායකි. මෙම වාතාවරණය මත ළමයින් සහ කාන්තාවන් වේදනාකාරී අත්දැකීම් රැසකට මුහුණදෙන ලදී. ළමයින්ගේ පූර්ව ළමා විය වර්ධනය සඳහා අවශ්‍ය පරිසරය අහිමි වීම හා ඔවුන්ගේ අධ්‍යාපන ඉඩ ප්‍රස්තාවන් අහිමි වීමත් යුද්ධයේ අනිසි ප්‍රතිඵලයන් ය.

යුද්ධයක් හේතු කොටගෙන සමාජ සංස්ථාවලින් ඉටු විය යුතු කාර්යභාරයන් අඩාළ විය හැකි ය. ඒ පිළිබඳව එක් එක් සමාජ සංස්ථාවන්ට අදාළ ව සාකච්ඡා කළ හැකි ය.

සමාජ දේහයේ කුඩා ම සංවිධානාත්මක ඒකකය වන පවුල් ඒකකය විසංවිධානය වීම යුද්ධය හේතු කොටගෙන සිදු විය.

> "මානව පවුල සමාජයේ කුඩා ම සමාජ සමූහය වශයෙන් සමාජ පැවැත්මට විශාල මෙහෙයක් ඉටු කරයි. එහෙත් යුද්ධයෙන් විනාශ වන, මියයන පුද්ගලයන්ගේ පවුල් මෙසේ ඍජු ලෙස ම පීඩනයට පත් වේ. බොහෝ

විට දෙමාපියන්ට දරුවන් අහිමි වන, භාර්යාවන්ට ස්වාමිපුරුෂයන් අහිමි වන, දරුවන්ට දෙමාපියන් අහිමි වන තත්වයක් තුළ එම පවුල් පවත්වාගෙන යාම විශාල ගැටලුවක් වේ. රජය මඟින් වන්දි මුදලක් ලබාදුන්න ද එය පවුල් ඒකකයේ අඛණ්ඩ පැවැත්මට ස්ථාවර පදනමක් ඇති නො කරයි. ස්වාමිපුරුෂයන් අහිමි වූ තරුණ කාන්තාවන්ට තම ඉදිරි සමාජ ජීවිතය වැන්දඹුවන් වශයෙන් පවත්වාගෙන යාම විශාල අභියෝගයකි. අංගවිකල වූ සිය ස්වාමිපුරුෂයා ඇතුළු දරුවන් නඩත්තු කිරීමට සිදුවීම ඇය ඉදිරියේ ඇති විශාල සමාජ ප්‍රශ්නයකි. විශේෂයෙන් ආර්ථික ගැටලු හමුවේ මෙවැනි පවුල්වල සමබරතාව බිඳී යාමට බෙහෙවින් ඉඩකඩ තිබේ." (කරුණාතිලක, 2007, පිටු අංකය 135)

යුද්ධයකදී ඍජු ලෙස ම බලපෑම් එල්ල වන්නේ ආර්ථික සංස්ථාවට යි. සතුරන් ප්‍රහාර එල්ල කරන්නේ ආර්ථික මර්මස්ථානවලට ය. ලංකාවේ යුද්ධය ආරම්භ වීමෙන් පසු මහ බැංකුව, හිල්ටන් හෝටලය, කටුනායක ගුවන් තොටුපළ, වරාය වැනි ලංකා අර්ථිකයේ ප්‍රමුඛස්ථානවලට ප්‍රහාර එල්ල කිරීම තුළින් එල්. ටී. ටී. ඊ සංවිධානය අපේක්ෂා කළේ ලංකාවේ ආර්ථිකය දුර්වල කිරීමටයි. රටක යුද්ධයක් පවතින විට රටේ සංවර්ධනයට ඇති මුදල් ඒ සඳහා වැය වේ. තරුණ ප්‍රජාවන්ට රැකියා සැපයීමට ඇති මුදල් ඒ සඳහා වැය වන අතර ඔවුන් විරැකියාවෙන් පෙළීමෙන් සිදු වන්නේ සමාජ ප්‍රශ්න තවදුරටත් තහවුරු වීමකි. 1989 තරුණ කැරැල්ල එවැන්නකි. ලංකාවේ යුද්ධ වියදම් වර්ෂයෙන් වර්ෂය ඉහළ යාම හේතුවෙන් ආරක්ෂක බද්දක් අය කර ඇත. එසේ ම සංචාරක කර්මාන්තයට යුද්ධය බලපෑම් කර ඇත. ආසියාවේ හොඳ ම වෙරළ තීරුව වන නැඟෙනහිර වෙරළ තීරය (නිලාවේලි) අහිමි විය. සංචාරක කර්මාන්තයෙන් මෙරටට ගලා ආ ආදායම මේ හේතුවෙන් අහිමි විය.

නීතිය හා සිරිත යන සංස්ථාවන් කෙරෙහි යුද්ධයේ බලපෑම විමසා බැලීමේදී ජනතාවගේ මූලික අයිතීන් යුද්ධය හේතු කොටගෙන උල්ලංඝනය වී ඇත. එසේම 1983 සිට ක්‍රියාත්මක වූ හදිසි නීතිය යටතේ රටක සාමාන්‍ය නීතිය ක්‍රියාත්මක නො වී ය. එසේ ම ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත් සහ නීතීන් මඟින් මූලික

අයිතිවාසිකම් තුළ ජනතාවට ලබාදී ඇති නිදහස සීමා කරයි. එසේ ම මාර්ගයේ ආරක්ෂක මුරපොළවල් අසල රථවාහන සෝදිසි කිරීම් සිදු කරන අතර ඒ සඳහා පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද හැඳුනුම්පත අනිවාර්ය කර ඇත. මාර්ග බාධක යොදා මගී ජනතාව පරීක්ෂා කිරීම මඟින් කාලය අපතේ යාම හා හැඳුනුම්පත අමතක වීමක් හෝ වෙනත් හේතූන් මත අනන්‍යතාව ඔප්පු කරගත නො හැකි වුවහොත් ඔවුන් අත්අඩංගුවේ තබාගනියි.

ලංකාවේ ආගමික සංස්ථාව යුද්ධය හේතු කොටගෙන බිඳවැටී ඇත. අරංතලාවේ භික්ෂු ඝාතනය, ශ්‍රී දළදා මාළිගයට බෝම්බ ප්‍රහාරයන් එල්ල කිරීම ත්‍රස්තවාදීන් ආගම තුළින් පළිගැනීමට ගත් උත්සාහයන් ය. වර්තමානයේ ආගමික සංස්ථාවේ කාර්යභාරය වෙනස් වී ඇත. ජනප්‍රිය බුද්ධාගම තුළ බෝධි පූජාව සුලබ ය. එහිදී ත්‍රිවිධ හමුදාවට සහ පොලිසියට සෙත් පතා බෝධි පූජා පැවැත්වීම තුළින් යුද කිරීමට අවශ්‍ය මානසික ශක්තිය, සතුරන් මෙල්ල කිරීමට ශක්තිය ලබාදීම අපේක්ෂා කරයි. එසේ ම යුද්ධයෙන් මියගිය රණවිරුවන් වෙනුවෙන් සංඝාර කුලුනු, බෝධි ප්‍රාකාර ඉදි කිරීම්, මල් අසුන් අලුත්වැඩියා කිරීම් දක්නට ලැබේ. කතෝලික ආගමිකයෝ ද යාච්ඤා කිරීම, සාම පූජා පැවැත්වීම සිදු කරති. ලංකාවේ යුදමය වාතාවරණය හේතු කොටගෙන යුද්ධය පවතින ප්‍රදේශවල ජනතාවගේ ආගමික ක්‍රියාකාරකම් බිඳ වැටී ඇත. උතුරු - නැගෙනහිර ප්‍රදේශවල තිබූ විහාරස්ථාන, කෝවිල් වැනි පූජනීය ස්ථාන රැසක් විනාශ වී ඇත.

ශ්‍රී ලාංකික සමාජයේ යුදමය වාතාවරණය පිළිබඳව සාකච්ඡා කිරීමේදී දේශපාලන සංස්ථාව යුද්ධයේ ඍජු බලපෑමට ලක් වේ. යුද්ධය බොහෝ විට දේශපාලන ක්‍රියාදමයක ප්‍රතිඵලයකි. යුද්ධයක් හේතු කොටගෙන දේශපාලනඥයන්ගේ ජීවිත අවදානම වැඩි විය. ඔවුන්ගේ ජීවිත ආරක්ෂාව වෙනුවෙන් සන්නද්ධ කණ්ඩායම් යොදවා ඇත. රජයෙන් ලබාදෙන ආරක්ෂක නිලධාරීන්ට අමතරව ඔවුන්ට පෞද්ගලික ආරක්ෂකයෝ සිටිති. ඒ හේතුවෙන් ඔවුන් සමාජය තුළ විශේෂ අධිකාරී බලයක් ආරෝපණය කරගනී. යුද්ධය හේතු කොට ගෙන උතුරු - නැගෙනහිර ජනතාවගේ ඡන්ද අයිතිය මෑතක් වන තුරු ම අහිමි වී තිබිණි. එසේ ම මූලික අයිතිවාසිකම්,

පරමාධිපත්‍යය, ස්වෛරීභාවය වැනි ප්‍රජාතන්ත්‍රවාදී බලකණු යුද්ධය හේතු කොටගෙන දෙදරා ගොස් ඇත.

උක්ත කරුණු සාකච්ඡා කිරීමේදී පැහැදිලි වන්නේ යුද්ධයක බලපෑම සමාජ සංස්ථා කෙරෙහි ව්‍යාප්ත වන ආකාරයයි. කෘත්‍යාත්මක ක්‍රමය ඔස්සේ යුද්ධයේ සාමාජීය බලපෑම පිළිබඳව විමසීමේදී එහි අයහපත් බලපෑම වැඩි වුව ද සමහර කරුණු සමාජ සංස්ථාවේ උන්නතියට හේතු වේ.

රටක හමුද ශක්තිය වර්ධනය වීම යුද්ධයේ යහපත් ප්‍රතිඵලයක් ලෙස දැක්විය හැකි ය. මන්ද යත්, ලොව බලවතුන් තීරණය කරන එක් සාධකයක් වන්නේ යුදමය වාතාවරණය යි. එහිදී අවි ආයුද වැනි භෞතික දෑ මෙන් ම මානව සම්පත් ද යුදමය වාතාවරණයකට අනුවර්තනය වේ. එහිදී මුලින් යොදගත් ගරිල්ලා සටන් ක්‍රම වෙනුවට මල්ටි බැරල්, රොකට්, කාලතුවක්කු හා මිසයිල වැනි තියුණු ආයුද දක්වා තාක්ෂණික වශයෙන් වෙනසක් ගොඩනඟයි. එසේ ම හමුද සංවිධානවල සහ පොලිසියේ පිරිස් බල වැඩි වීම ද මේ ගණයෙහි ලා ගැනෙන යහපත් කෘත්‍යයකි.

දෙවනු ව, වැදගත් වන්නේ යුදමය ක්ෂේත්‍රයේ රැකියා ජනිත වීම හා එම පුද්ගලයන්ගේ පැවැත්ම ආරක්ෂා වීම යි. එහිදී හමුද සේවය එසේ ම ඊට සෘජු හා වක්‍ර ආකාරයෙන් සහයෝගය ලබාදෙන්නන්, අවි නිෂ්පාදනය, අවි ප්‍රවාහනය, යුද ඇඳුම් නිපදවන්නන් බිහිවීම තුළ විරැකියාවට පිළියම් ලැබේ. 2008 දී හමුද සෙබළුන් 40,000 ක් බඳවා ගත් අතර ලංකාවේ එතෙක් පැවති විරැකියාවට සාර්ථක විසඳුමක් ඉන් ලැබිණි.

තෙවනු ව, වැදගත් වන්නේ යුදමය ආර්ථිකයක් රට තුළ ගොඩනැඟීමයි. එසේ ම යුද්ධයෙන් අවතැන් වූවන් කේන්ද්‍ර කොටගත් යුදමය සුභසාධනයක් ක්‍රියාත්මක වීමත් ය. එසේ ම ජනගහනය පාලනයට ද ස්වාභාවික ක්‍රියාවලියක් ලෙස යුද්ධය හේතු වේ. යුද්ධය හේතු කොටගෙන සමස්ත සමාජයේ පුද්ගල භූමිකා මෙන් ම සමාජ සංස්ථා වෙනස් වීමට ලක් වේ.

එසේ ම යුද්ධය හේතු කොටගෙන ලංකාවේ උතුරු-නැඟෙනහිර ප්‍රදේශවල ජනතාව අතර උපසංස්කෘතියක් බිහි වී ඇත. ඊට හේතුව වන්නේ ඔවුන්ගේ පැවති ජීවන රටාවේ බිඳවැටීම සහ

ඒ ආශ්‍රිතව පැවති චර්යා රටාවන් බිඳ වැටීම මත ඔවුන්ගේ ජීවන ශෛලීන් වෙනස්වීමට ලක් වීම යි. යුද්ධය හේතු කොටගෙන නව මාධ්‍ය සංස්කෘතියක් නිර්මාණය වී ඇත. රූපවාහිනීවල විකාශනය වන ටෙලිනාට්‍ය, සිනමා කෘති, නවකතා, ගීත, කවි, කෙටිකතා යන සාහිත්‍ය නිර්මාණයන්ගේ තේමාව වී ඇත්තේ යුද්ධය යි.

තව ද බෝම්බ සංස්කෘතියක් බිහි වීම ද යුද්ධයේ ප්‍රතිඵලයකි. මරාගෙන මැරෙන මිනිස් බෝම්බ යොදාගෙන සිවිල් ජන ජීවිත, ප්‍රභූ ජන ජීවිත විනාශ කිරීම, ආර්ථික, දේශපාලනික, ආගමික මර්මස්ථානවලට පහර දීම මඟින් සමාජ ප්‍රවාහයට බාධා එල්ල කිරීමට ඔවුන් සමත් වී ඇත. 70 දශකයේදී බෝම්බ යන වචනය ලංකාවට එතරම් හුරුපුරුදු නො වී ය. එහෙත් එය අද වන විට සාමාන්‍යකරණය වී ඇත. ඒ ආශ්‍රිත ව සමාජ ව්‍යුහය නිර්මාණය වී ඇත. විනිවිද පෙනෙන බෑග් පාසල් ළමුන්ගේ පාසැල් උපකරණවලට එකතු වීම, පාසල් ආශ්‍රිත ව බෝම්බ ප්‍රහාරයකට සූදානම් වන පුහුණු කිරීම් සිදු කිරීම මෑතකාලීන ව දකගත හැකි විය. ඒ අනුව බෝම්බ කේන්ද්‍ර කරගත් සංස්කෘතියක් මහ සංස්කෘතියට එකතු විය.

සිවිල් ජන සමාජය යුද්ධය හේතු කොටගෙන ප්‍රබල බිඳ වැටීමකට ලක් විය. අන්‍යොන්‍ය සැකය, ජීවිත අනපේක්ෂිත බව බෝම්බ සංස්කෘතිය මඟින් නිර්මාණය කොට ඇත. ලංකාවේ තිස් වසරක යුද්ධය හේතු කොටගෙන යුදවාදී මානසිකත්වයක් නිර්මාණය වී ඇත. එක් පවුලකින් එක් අයකු හෝ යුද්ධයට යාමේ ප්‍රවණතාවක් පසුගිය කාලයේ දක්නට ලැබුණි. අවමංගල්‍ය උත්සව සංවිධානයේදී රණවිරුවකුගේ අවමංගල්‍ය කටයුතු රාජ්‍ය ගෞරව සහිත ව සිදු වීම තරුණයන් යුද බිමට ආකර්ෂණය වීමට එක් හේතුවක් විය.

එසේ ම යුදමය පරිසරයක වැඩෙන අනාගත පරපුරේ ක්‍රියාකාරකම් පිළිබඳ සාකච්ඡා කිරීම වැදගත් වේ. අද කුඩා දරුවා ද යුද මානසිකත්වයෙන් පෙළේ. මීට දශක දෙක තුනකට පෙර දරුවන් සෙල්ලම් කළේ පොල්කටු, කුරුම්බා ඇට්ටි, බෝනික්කන් යොද ගෙන ය. අද දරුවන් ඉල්ලන්නේ තුවක්කුව යි. එසේ නැතිනම් ප්‍රහාරක යානාවල ආකෘති ලෙස ඇති සෙල්ලම් උපකරණ යි. පෙර පාසල්වල ක්‍රීඩා පිටිය යුද පුහුණු පිටියක් සේ ය. විවිධ ඇඳුම් තරගවලට නිරූපණය කරන්නේ ආරක්ෂක නිලධාරීන්ගේ

චරිත යි. තව ද දරුවන් විවිධ අවස්ථාවල වෙඩි බෙහෙත් මඟින් හෝ වෙනත් ක්‍රමවලින් බෝම්බ අත්හද බලන්නට ගොස් සිදු කරගත් අනතුරු බොහෝ ය. ඒ අනුව යුද්ධය ළමා සමාජානුයෝජනයට බලපෑමක් එල්ල කර ඇත.

> "ශ්‍රී ලංකාවේ යුද්ධය නිසා මේ දක්වා ජීවිත 58,000 සිට 90,000 දක්වා වන පරාසය අතර සංඛ්‍යාවක් විනාශ වී ඇති බවට තොරතුරු හෙළි වී ඇත. ශ්‍රී ලංකාවේ යුද්ධය හේතු කොට ගෙන දනට ළමයින් 270,000 කට වැඩි සංඛ්‍යාවක් අවතැන් වී ඇතැයි පැවසේ. ශ්‍රී ලංකාවේ උතුරුකරයේ මෙන් ම දකුණුකරයේ ද ළමයින්ට දහස් ගණනින් තම පියා හෝ මව නැත්නම් දෙමාපියන් දෙදෙනා ම යුද්ධයේ ඍජු හෝ වක්‍ර බලපෑම් හේතු කොටගෙන අහිමි වී ගොස් ය. එබැවින් දරුවා සමාජගත කිරීමේදී අත්‍යවශ්‍ය කාර්යභාරයක් ඉටු කරනු ලබන පියාට හිමි වන කාර්ය කොටස තම දරුවාට අහිමි වන්නේ ය." (ගුණරත්න, 2005, පිටු අංක 313-314)

උක්ත කරුණු විමර්ශනය කිරීමේදී යුද්ධය හේතුවෙන් සමාජය ව්‍යාකූල වීම හා සමාජ ප්‍රශ්න ඇති වීම සිදු වේ. ලාංකික සමාජය තුළ ද සමාජ දේහය විෂමකාරී වී ඇත. රටේ පවත්නා වූ ප්‍රජාතන්ත්‍රවාදී ස්වරූපය ඉවත් ව ගොස් යුදමය වාතාවරණයක් ඇති වීම අපරාධ රැල්ල සහ සොරකම් වැඩි වීම, ස්ත්‍රී දූෂණ, මංකොල්ලකෑම්, ලිංගික අපයෝජනය, ත්‍රිවිධ හමුද සේවයෙන් පලා ආ සෙබළුන්ගේ ක්‍රියාකාරකම්, පාතාල ක්‍රියා වර්ධනය යුද්ධයේ සමාජීය බලපෑම් ය.

අනෙක් අතට සාරධර්ම පද්ධතිය බිඳ වැටීම, ඒ තුළ ගුණධර්ම නොපිළිගැනීම, මිනිස් ජීවිතවල වටිනාකම ගිලිහී යාම හා ප්‍රචණ්ඩකාරී වීම දකගත හැකි ය. ඒ හේතුවෙන් රැම්බෝ සංස්කෘතියක් ගොඩනැගේ. මේ අනුව ලංකාවට සිදු වී ඇති බලපෑම් තුළින් ශ්‍රී ලංකා සමාජ සංවිධානයට සහ ශ්‍රී ලංකා සමාජ ව්‍යුහයට කෙටිකාලීන මෙන් ම දීර්ඝකාලීන ව ද එල්ල වූ බලපෑම හේතුවෙන් සමාජ විසංවිධානය වීමට හේතු වී ඇත.

## ආශ්‍රිත ග්‍රන්ථ


- අශෝක, කේ. ජී. (2996) සමකාලීන සමාජ ගැටුම් විසඳාලීම සඳහා බෞද්ධ ඉගැන්වීම්වල අදාළත්වය, සම්භාෂා, 14 වෙනි කලාපය, අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් අධ්‍යාපන ශාඛාවේ ප්‍රකාශනයකි.
- ඇඳගම, මාලනී (1994) ලෝක ඉතිහාසය, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.
- උයන්ගොඩ, ජයදේව (2003) ගැටුම් සිවිල් යුද්ධ සහ සාමය ගොඩනැගීම, කොළඹ, සමාජ විද්‍යාඥයන්ගේ සංගමය.
- ඔබේසේකර, ධනංජය යුද්ධය සහ ජාවාරම, සාම විමර්ශී, 2002 නොවැම්බර්-දෙසැම්බර්, 2 වැනි කාණ්ඩය, 5 වැනි කලාපය, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය
- කටුගම්පෙළ, රාජා (2007) සංග්‍රාම පුරාණය, කොළඹ, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ
- කරුණාතිලක, කේ (1998) සමාජ විද්‍යා න්‍යාය, කඩවත, මාලිංග ප්‍රකාශකයෝ.
- කරුණාතිලක, කේ (2007) ප්‍රායෝගික සමාජ විද්‍යාව, කඩවත, මාලිංග ප්‍රකාශකයෝ.
- කරුණාදාස, ඩබ්ලිව්. එම්. (2000) ජාත්‍යන්තර අර්බුද, දෙහිවල, ඉමේජ් ලංකා ප්‍රකාශකයෝ.
- ගුණරත්න, එම්. චන්ද්‍රන (2005) සමාජයේ ඇති සංයුක්ත බව සහ සමකාලීන ශ්‍රී ලංකාවේ සමාජ ප්‍රශ්න, කොළඹ, ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ.
- ඩයස්, විජේ (2000) වර්ගවාදී යුද්ධයට 25 වසරක්, කොළඹ, කම්කරු මාවත ප්‍රකාශකයෝ.
- දික්වැල්ල, රංජිත්, ප්‍රියන්ත, රේණුක සහ හෙට්ටිආරච්චි, ශිරාණි (2003) ගැටුම් නිරාකරණය න්‍යාය සහ භාවිතය, වරකාපොළ, ආරිය ප්‍රකාශකයෝ.
- ජයසිංහ, ඒ. කේ. ජී (2006) සමාජ විද්‍යාත්මක න්‍යාය, කඩවත, කඩුල්ල ප්‍රකාශකයෝ.
- පීරිස්, ජනදාස (2007) ජාතික ගැටලුව: ගෝත්‍රික රාජ්‍යයේ සිට ගෝලීය රාජ්‍ය දක්වා, කොළඹ 06, පික්ස් ඇන්ඩ් වර්ඩ්ස් ප්‍රකාශනයකි.
- බාලසූරිය, ඒ. එස්. ගැටුම් සමථකරණ ක්‍රියාවලිය, අහිංසා, නුගේගොඩ, ගැටුම් නිරාකරණය සහ සාම කේන්ද්‍රය.
- රත්නායක, ආර්. එම්. කේ. ඩී. කේ (2001) සුහද බවින් පිරිපුන් සිංහල හා දමිළ ජන සමාජයක්, ශ්‍රී ලංකාවේ ජාතික පුස්තකාලයේ ප්‍රකාශනයකි.
- රණවක, ඇඩ්වින්, ලොකුලියන, ලයනල් සහ සේනානායක, පුණ්‍යා (1959) වර්තමාන ලෝක ඉතිහාසය, කොළඹ, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.
- විමලධර්ම, සාරා ද සිල්වා, අමරසිරි සහ ද සිල්වා නිලක්ෂි (2006) යුද්ධයත් සමග වැඩීම, දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය.

- වීරසූරිය, ගුණසිරි (1996) යුද්ධය, වරකාපොළ, ආරිය ප්‍රකාශකයෝ.
- සෙනෙවිරත්න, අනුරාධ (2001) එකල්හි සිංහලයෝ ද කොටියෝ ද මෙසේ ජීවත් වූහ, නුගේගොඩ, සරසවි ප්‍රකාශකයෝ.
- සෙනෙවිරත්න, චාමින්ද (1990) නිරාකරණය සාමය සහ සංවර්ධනය, කොළඹ, ඇම්.ඩී. ගුණසේන සහ සමාගම.
- Clarance,William (2007) Ethnic Warfare in Sri Lanka, Colombo 04, Vijitha Yapa.
- Cole,Bemjamin (2006) Conflict, Terrorism and The Media in Asia, Abingdoon, Routledge, 2 Park Square.
- Melean, Iain & Mcmillan, Alistair (1996) The Concise Oxford Dictonary of Political, New York, Macmillan Educational Company.
- Misra,S.S(1995) Ethnic Conflict and Security Crisiis in Sri Lanka, Delhi, Kalinga Publication.
- Nehru,Jawaharlal (1982) Glimpses and World History, New York, Oxfoed University Press.
- Nortor, B.P. & Wihoetz, Philip (1976) Encyclopaedia Britannica, Volume 29.
- Radhakrishnan (1961) The Hindu View of life, Unwin Book.
- Raman, B, moorthy, N. Sathiya & Chittaranjjan Kalpana (2006) Sri Lanka Peace Without Peocess, Colombo 04, Vijitha Yapa.
- Scott,P.W.(1988) Disctionary of Sciology, Delhi, Ashwani Goyal for GOYL SaaB.
- Taylor, A.J.P.(1963) The Origna of the Second World War, London, Hamish Hamilton Ltd.
- Wehmeier, Sally (1948) Oxford Advanced Leorner's Dictionary, New York, Oxford University Press.